වාර්ෂික වාර්තාව 2024
ஆண்டு அறிக்கை 2024
ANNUAL REPORT 2024

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

ஜய கன்டேனர் டர்மினல்ஸ் லிமிடெட்

Jaya Container Terminals Limited

සිංහල පරිවර්තනය

පටුන

01. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 1

02. සභාපතිවරයාගේ පණිවිඩය 4

03. සමාගම පිළිබඳව හැඳින්වීම 5

04. කළමනාකරණ කණ්ඩායම 8

05. අංශමය කාර්යසාධනය 9

06. ආයතනික පාලනය 18

07. විගණන කමිටු වාර්තාව 19

08. විගනිත මූල්‍ය ප්‍රකාශන 22

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2024 දෙසම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශය සහ එහි විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔබ අතට පත් කරනු ලබන්නේ ඉතා සතුටිනි.

<u>නෛතික තත්වය</u>

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගම 1982 සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සහ පිහිටි සහ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියා පදිංචි කල සීමිත වගකීම් සහිත සමාගමකි.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, පල්ලිය වීදිය, අංක 19 හි පිහිටා ඇති අතර ව්‍යාපාරය කොළඹ 15 වෝල්ස් පටුමගේ අංක 69 හි ස්ථාපිත කොට ක්‍රියාත්මක කෙරේ.

<u>ප්‍රධාන කටයුතු</u>

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යය වන්නේ බ්ලූමැන්ඩල්හි (අංක 69, වෝල්ස් පටුමඟ කොළඹ 15) පිහිටි කොළඹ තෙල් බැංකුව කළමනාකරණය කොට ක්‍රියාත්මක කිරීම වන අතර එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) බන්ධිත ගුදමකි. අප ආයතනයේ කොළඹ තෙල් බැංකුවේ මෙහෙයුම් කරගෙන යාම සඳහා කලමනාකරණ සේවා ගිවිසුමක් යටතේ කලමනාකරණ නියෝජිතයෙක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පත් කර ඇත.

<u>මූල්‍ය ප්‍රකාශන</u>

2025.02.19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ පිටු අංක 33 සිට 57 දක්වා ඉදිරිපත් කෙරේ.

<u>විගණකගේ වාර්තාව</u>

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව පිටු අංක 23 සිට32දක්වා ඇත.

<u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 38 සිට 46 දක්වා පිටුවල සඳහන් වන අතර පසුගිය වසරට සාපේක්ෂව එකී ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු වී නොමැත.

<u>අඛණ්ඩ පැවැත්ම</u>

නුදුරු අනාගතය සඳහා සමාගමට එහි මෙහෙයුම් කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ. ඒ අනුව ‘අඛණ්ඩ පැවැත්ම’ යන සංකල්පය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

	31.12.2024 දිනට	30.09.2024 දිනට
සභාපති	පී. එස්. උපුල් ප්‍රියන්ත මයා	ලක්මාල් රත්නායක මයා
කළමනාකාර අධ්‍යක්ෂ	**වෛද්‍ය** ජී. එස්. ඒ. කෝදාගොඩ මයා	**වෛද්‍ය** ජී. එස්. ඒ.කෝදාගොඩ මයා
අධ්‍යක්ෂ මණ්ඩලය	1. අද්මිරාල් එස්.එස්. රණසිංහ මයා (විශ්‍රාමික)	කේ. ඩී. බර්නාඩ් මයා
	2. ඉංජිනේරු හේරත් එම්. පී. ජයවර්ධන මයා	ජී. යූ. කේ. අලගෙවත්තගේ මයා
	3. උපුල් ධම්මික ජයතිස්ස මයා	බී. ආර්. එල්. ගුණවර්ධන මයා
	4. මහේන්ද්‍ර කුමාර ගරුසිංහ මයා	කෞශල්‍යා නවරත්න මයා
	5. ඩබ්ලිව්. ඩී. එල්. ජේ. කුලසූරිය මයා	සී. ඩබ්ලිව්. කේ. ධර්මසේන මයා -භාණ්ඩාගාර නියෝජිත
	6. එස්.ඒ. බටගොඩ මිය -භාණ්ඩාගාර නියෝජිත	

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 වර්ෂය තුළදී රැස්වීම් 09 ක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක විගණන කමිටුව 2024 වසර තුළදී රැස්වීම් 02ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත නම් සඳහන් අධ්‍යක්ෂවරු විගණන කමිටුවේ සාමාජිකයින් ලෙස **කටයුතුකර ඇත.**

1. **සී. ඩබ්ලිව්. කේ. ධර්මසේන මයා** – භාණ්ඩාගාර නියෝජිත , අධ්‍යක්ෂ - (සභාපති)
2. **බී. ආර්. එල්. ගුණවර්ධන මයා** – අධ්‍යක්ෂ – (සාමාජික)

<u>මෙහෙයුම් / මූල්‍ය කාර්ය සාධනය</u>

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් 2024 වසර තුළදී මෙට්‍රික් ටොන් 564,337ක් පැටවීම සහ මෙට්‍රික් ටොන් 568,705ක් මුදා හැරීම සිදු කර ඇත. සමාගම විසින් බ්ලූමැන්ඩල් තෙල් පර්යන්තයේ සිය ආනයනික ඉන්ධන ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් සැපයීමට නාවික තෙල් බලපත්‍ර දරන්නන් 11ක් සමඟ ගිවිසුම්වලට එළඹුණි.

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි කළමනාකාරිත්වය බංකර් මෙහෙයුම් වැඩි කිරීමට උපාය මාර්ග කිහිපයක් ක්‍රියාත්මක කළේය. කොළඹ තෙල් බැංකු පරිශ්‍රයේ සහ ඒ ආශ්‍රිත ප්‍රදේශයේ මෙට්‍රික් ටොන් 12000 ක ධාරිතාවයකින් යුත් ඉන්ධන ගබඩා ටැංකි/පහසුකම් දෙකක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දිගුකාලීන බදු පදනම මත ඉඩමක් ලබා දීම සඳහා ආයෝජකයෙකු තෝරාගෙන ඇත. ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගම මේ දක්වා වාර්තා කර ඇති වැඩිම ආදායම වූ රු. 719,870,640 ක මුදල 2024 වර්ෂයේදී වාර්තා කර ඇති අතර එය පසුගිය වසරට සාපේක්ෂව 18% ක වැඩි වීමකි.

2024 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2024 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 1,000,000/= කි.

දේපල, පිරියත හා උපකරණ

2024 වසර තුළ දේපල, පිරියත සහ උපකරණවල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් 05හි දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

අධ්‍යක්ෂවරුන් හට ගෙවන ලද පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශනයේ විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ දක්වා ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා පියවා තිබීම හෝ සමාගමේ පොත්වල වෙන්කර තිබීම පිළිබඳව අධ්‍යක්ෂවරුන් සෑහීමට පත්වේ.

ශේෂ පත්‍රයෙන් පසු සිදුවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කලයුතු ගැලපීම් අවශ්‍යවන සමාගමට සැලකියයුතු බලපෑමක් ඇති කරන කිසිදු වැදගත් සිදුවීමක් ශේෂ පත්‍රයේ දිනයෙන් පසුව සිදුවී නොමැත.

විගණකවරු

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 19වන සංශෝධනය පරිදි සමාගම විසින් විගණන නිලධාරියෙක් පත් කිරීම අවශ්‍ය වේ. විගණකවරුන් හට ගෙවූ ගාස්තු මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කරන විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ අනාවරණය කෙරේ.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය සඳහා විගණනය ජාතික විගණන කාර්යාලය විසින් සිදු කරන ලදී.

අධ්‍යක්ෂවරුන් දන්නා පරිදි ඉහත අනාවරණය කල කරුණු හැර සමාගම සමඟ කිසිඳු සම්බන්ධතාවක් (විගණකවරුන් ලෙස හැර) විගණකවරුන්ට නොමැත. විගණකවරුන්ට සමාගම සමඟ කිසිඳු බැඳියාවක් නොමැත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කල ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ඔවුන් ස්වාධීන බවට ඔවුහු තහවුරු කරති.

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්

.... සභාපති

.... අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

සභාපතිවරයාගේ පණිවුඩය

2024 මූල්‍ය වර්ෂය සඳහා ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපතිවරයාගේ පණිවිඩය ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන්නේ මහත් විශ්වාසයකින් සහ නැවුම් බලාපොරොත්තුවකින් යුතුවය.

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් ශ්‍රී ලංකා වරාය අධිකාරියට මුළුමනින්ම අයත් පරිපාලිත සමාගමක් වන අතර කොළඹ වරායට නාවික ඉන්ධන සපයනු ලබන ක්‍රියාවලියේ වැදගත් කාර්ය භාරයක් ඉටු කරමින් සිටී.

පවතින සාර්ව ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, සමාගම විසින් මූල්‍යමය වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව සහ මෙහෙයුම් ස්ථාවරත්වය පෙන්නුම් කර ඇත්තේ රු. මිලියන 719.8ක ආදායමක් ලබා ගනිමිනි. මෙය පෙර වසරට සාපේක්ෂව 17.6% ක වර්ධනයකි.

බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 347.9 ක් ලෙස වාර්තා වූ අතර ශුද්ධ ලාභය රු. මිලියන 243.4 ක් විය. මෙය පෙර වසරට සාපේක්ෂව 0.19% ක සුළු අඩුවීමකි. ගබඩා ධාරිතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ස්ථාවර තැන්පතු මුදල් ලබා ගැනීම සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ගැලපීමෙන් පසු පොලී අනුපාතවල සාමාන්‍ය පහත වැටීම යන හේතු වලට වඩා රජය විසින් අනුමත කරන ලද සේවක වැටුප් වැඩිවීම සහ මෙහෙයුම් ඉපැයීම්වලට වඩා මූල්‍ය ආදායමේ පහළ යාමේ පසුබිම තුළ මෙම සුළු අඩුවීම විමසා බැලිය යුතුය. කැපී පෙනෙන ලෙස, ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගම ශක්තිමත් මූල්‍ය තත්ත්වයක පවතී.

මෙම ප්‍රතිඵලවලින් පිළිබිඹු වන්නේ අපගේ කණ්ඩායමේ අඛණ්ඩ කැපවීම පමණක් නොව, යහපාලනය, නාස්තිය හා දූෂණය මුළුමනින්ම පිටුදැකීම සහ වත්මන් රජය විසින් දියත් කරන ලද ප්‍රතිඵල කේන්ද්‍රීය පරිපාලනය යන මූලධර්ම සමඟ මුළුමනින්ම සමපාත වන කළමනාකාරිත්වය විසින් තහවුරු කරන ලද විචක්ෂණශීලී මූල්‍ය භාරකාරත්වය සහ විනිවිද පෙනෙන මෙහෙයුම් ආචාර ධර්මයි. විදේශ ආදායම් විභවයන් සහිත ආර්ථික අවස්ථා හඳුනා ගැනීම සහ ප්‍රයෝජනයට ගැනීම සඳහා නව රජයේ ප්‍රමුඛතා ප්‍රතිපත්ති මඟ පෙන්වීමට සමගාමීව, සමාගම 2024 වසර අග භාගයේ දී ක්‍රමෝපායික විසඳුමක් වශයෙන් JCT හි සමස්ත ගබඩා ධාරිතාවය 60% කින් වැඩි කරන මෙට්‍රික් ටොන් 12000 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකි දෙකක් ඉදිකිරීම සඳහා මූලික පියවර ගනු ලැබීය.

ක්‍රියාකාරී ටැංකි 14ක් සහ ලියාපදිංචි බංකර් බලපත්‍රලාභීන් 11ක් සමඟින්, JCT ලිමිටඩ් සමාගම විසින් මාසිකව මෙට්‍රික් ටොන් 50,000කට වඩා වැඩි ප්‍රමාණයක නාවික ඉන්ධන ප්‍රතිදානයක් සඳහා අඛණ්ඩව සහාය දක්වයි. මේ වන විටත් ආරම්භ කර ඇති පුළුල් කිරීමේ වැඩ සටහන මඟින් විශ්වාසදායක සහ කාර්යක්ෂම නාවික ඉන්ධන සැපයීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කලාපීයව කොළඹ වරායේ තරඟකාරිත්වය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සියළුම තලයන්හි කාර්ය මණ්ඩලයන්ගෙන් ලැබෙන ස්ථිරසාර කැපවීම මා විසින් ඉතා හෘදයාංගමව පිළිගන්නා අතර ඔවුන්ගේ වෘත්තිකභාවය සහ අධිෂ්ඨානශීලී බව අපගේ සාර්ථකත්වයට පදනම වී ඇත. ජාතික සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වය සහ උපාය මාර්ගික දූරදර්ශීභාවය පවත්වා ගෙන යාමට අපි එකාවන්ව ඇප කැපව සිටිමු.

අප ඉදිරි වර්ෂය කරා විශ්වාසයෙන් යුතුව පිය නගන්නේ අප කරනු ලබන සියළු දේ තුළ තිරසර වර්ධනය, **සේවා** විශිෂ්ටත්වය සහ මනා පාලනය ඇති කිරීමේ අධිෂ්ඨානයෙන් යුක්තවය.

....

උපුල් පනාවැන්නගේ
සභාපති
ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

සමාගම පිළිබඳව හැඳින්වීම

අපගේ දැක්ම

ආසියානු කලාපයේ නාවික යාත්‍රා සඳහා ඉන්ධන සපයන කේන්ද්‍රස්ථානය බවට පත් වීම

අපගේ මෙහෙවර

නාවික ඉන්ධන සැපයීමේ බලපත්‍ර හිමිකරුවන් හට යටිතල/ගබඩා පහසුකම් සංවර්ධනය කර දීම තුළින් රටේ වටිනාකම උපරිම තලයකට ගෙන ඒම

පරමාර්ථ

- ✓ නාවික ඉන්ධන ගබඩා කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ නාවික ඉන්ධන සැපයීමේ ව්‍යාපාරයේ කේන්ද්‍රස්ථානය ලෙස කාර්යක්ෂම හා ඵලදායී අයුරින් කොළඹ තෙල් බැංකුව කළමනාකරණය කිරීම.
- ✓ ආදායම් ඉපයීම් උපරිම මට්ටමකට ගෙන ඒම සහ ඵලදායී පිරිවැය කළමනාකරණ ක්‍රමවේද තුළින් මූල්‍ය ස්ථාවරත්වය සහ තිරසාරබව තහවුරු කර ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා අඛණ්ඩව ප්‍රබල දායකත්වයක් සැපයීම.
- ✓ පරිශ්‍රයෙහි ඇති නිෂ්පාදන ගබඩාවෙහි ආරක්ෂාව තහවුරු කිරීම.
- ✓ සියළුම සේවකයින් අතර ඉහළ ඵලදායිතා මට්ටමක් වර්ධනය කර පවත්වා ගෙන යාම.
- ✓ සෞඛ්‍යය, ආරක්ෂාව සහ පරිසර හිතකාමී ක්‍රියාමාර්ග හඳුන්වා දීම.
- ✓ පාරිභෝගිකයින් හට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීම.

සමාගම පිළිබඳව හැඳින්වීම

කොළඹ තෙල් බැංකුව ලෙසින්ද හඳුන්වනු ලබන ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම (JCT සමාගම) ශ්‍රී ලංකා වරාය අධිකාරියට සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගමක් වන අතර එය කලාපය තුළ ප්‍රමුඛ පෙළේ ඉන්ධන ගබඩා කිරීමේ හා සැපයීමේ ආයතනයක් වේ. ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම (PB 960) 2002 වර්ෂයේ පෙබරවාරි 21 වන දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද අතර 100% ක්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සමාගමක් වශයෙන් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 වර්ෂයේ අප්‍රේල් 25 වන දින ලියා පදිංචි කරන ලදී.

2008 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ 15 වෝල්ස් පටුමගේ අංක 69 හි පිහිටි කොළඹ තෙල් බැංකුව කළමනාකරණය සහ පාලනය කිරීමේ වගකීම ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම වෙත පවරන ලදී. නාවික ඉන්ධන සැපයීමේ බලපත්‍ර හිමිකරුවන් (BLHs) හට ආනයනය කරන ලද ඉන්ධන ගබඩා කිරීම සඳහා පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා රේගුවේ අනුමත සහ පාලනය යටතේ පවත්නා ලෙස ස්ථාපිත කරන ලද එකී කොළඹ තෙල් බැංකුව කළමනාකරණය හා පාලනය කිරීම සමාගමේ ප්‍රධාන කාර්යය වේ.

ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ මූලික කාර්යය වන්නේ නෞකා වලට ඉන්ධන සැපයීමේ බලපත්‍ර හිමි කරුවන් හරහා කොළඹ වරායට පැමිණෙන යාත්‍රා සඳහා සපයනු ලබන නාවික ඉන්ධන ගබඩා කර තැබීමයි. සල්ෆර් අඩු ඉන්ධන තෙල් (LSFO) සහ නාවික ගෑස් තෙල් (MGO) යන ඉන්ධන කාණ්ඩ වලට අයත් නාවික ඉන්ධන එකී පරිශ්‍රයේ දැනට ගබඩා කර ඇති අතර මීට පෙර 2019 වර්ෂයේ අවසානය දක්වා ගබඩා කරන ලද්දේ බර ඉන්ධන තෙල් (HFO) 380 සහ අතර මැදි ඉන්ධන තෙල් (IFO) 180 ය. වර්තමානයේදී, මෙට්‍රික් ටොන් 38,200 ක ධාරිතාවයකින් යුත් නාවික ඉන්ධන ගබඩා කිරීමට හැකි ඉන්ධන ටැංකි 14ක් සමාගම සතුව පවතී. කොළඹ 15 බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ අක්කර 9 කට වැඩි භූමි ප්‍රමාණයක ඉහත සඳහන් සේවා පහසුකම ස්ථාපිත කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

31.12.2024 දිනට ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

සභාපති	පී. එස්. උපුල් ප්‍රියන්ත මයා
කළමනාකාර අධ්‍යක්ෂ	වෛද්‍ය ජී. එස්. ඒ. කෝදාගොඩ මයා
අධ්‍යක්ෂ මණ්ඩලය	1. අද්මිරාල් එස්.එස්. රණසිංහ මයා (විශ්‍රාමික)
	2. ඉංජිනේරු හේරත් එම්. පී. ජයවර්ධන මයා
	3. උපුල් ධම්මික ජයතිස්ස මයා
	4. මහේන්ද්‍ර කුමාර ගරුසිංහ මයා
	5. ඩබ්ලිව්. ඩී. එල්. ජේ. කුලසූරිය මයා
	6. එස්.ඒ. බටගොඩ මිය - භාණ්ඩාගාර නියෝජිත

කළමනාකරණ කණ්ඩායම

1. ලොරීන් ද සිල්වා
නීති හා මානව සම්පත් ප්‍රධානී

ලොරීන්ද සිල්වා මහත්මිය 2009 දී ජය කන්ටේනර් ටර්මිනල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නීති නිලධාරි / ලේකම් ලෙස ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ සේවයට එක් වූවාය. ඇය වෘත්තියෙන් නීතිඥවරියක් වන අතර, කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ උපාධිධාරිනියකි. ඇය නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් පිළිබඳ පශ්චාත් උපාධියක්ද ලබා ඇත. ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගම හා සම්බන්ධ වීමට පෙර ඇය මානව හිමිකම් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කලාය. ඇය 2016දී මානව සම්පත් හා නීති අංශ ප්‍රධානී ලෙස උසස් කරන ලදී.

2. සුගන්දිකා එම් ලංසකාර
මූල්‍ය ප්‍රධානී

සුගන්ධිකා ලන්සකාර මහත්මිය 2009 ජූලි මාසයේදී ගණකාධිකාරීවරියක් ලෙස ජය කන්ටේනර් ටර්මිනල් සමාගමේ සේවයට එක්වූවාය. ඇය කළමනාකරණ ගණකාධිකාරීවරියක් වන අතර වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (FCMA) (CGMA) සාමාජිකාවකි. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබාගෙන ඇත. ඇය 2012 වර්ෂයේදී මුදල් ප්‍රධානී තනතුරට උසස් කරන ලදී.

3. නලින් විතානපතිරණ
ඉංජිනේරු ප්‍රධානී

නලින් විතානපතිරණ මහතා 2010 පෙබරවාරි මාසයේදී ජය කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් සමාගමේ සේවයට බැඳුනේ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් වශයෙනි. ඔහු යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකයෙකි. ඔහු පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා ගෙන ඇත. 2012 වසරේදී ඔහු ඉංජිනේරු ප්‍රධානී තනතුරට උසස් කරන ලදී.

4. නලින්ද රාජසිංහ
ව්‍යාපාර සංවර්ධන හා මෙහෙයුම් ප්‍රධානී

නලින්ද රාජසිංහ මහතා 2010 ජූනි මාසයේදී ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමට සම්බන්ධ වූයේ මෙහෙයුම් හා ව්‍යාපාර සංවර්ධන ප්‍රධානියා වශයෙනි. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධියක් හදාරමින් සිටින අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් MBA (ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිය) ලබා ගෙන ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ උපාධියක් (BBA - ව්‍යාපාර පරිපාලන උපාධිය) ලබා ඇත.

අංශමය කාර්ය සාධනය

1. මෙහෙයුම් අංශය

අදාළ ගාස්තු ගෙවීමට යටත්ව ඉන්ධන පිරවීම් බලපත්‍රධාරීන් විසින් කොළඹ වරාය හරහා කොළඹ තෙල් බැංකුවට නාවික ඉන්ධන ආනයනය කර මුදා හරිනු ලැබේ. සමාගම විසින් ඔවුන් ආනයනය කරන ලද තෙල් සමාගමේ ඉන්ධන ටැංකි වෙත ගොඩබෑමට සහ එම තෙල් නැවත බත්තල් මත පැටවීම සඳහා ගබඩා පහසුකම් සහ පොම්පකිරීමේ පහසුකම් සපයනු ඇත. මේ වන විට කොළඹ තෙල් බැංකුව සමඟ ක්‍රියාත්මක වන ඉන්ධන පිරවීම් බලපත්‍රලාභීන් එකොළොස් දෙනෙක් (11) සිටී. පහත සඳහන් නිෂ්පාදන ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ ඉන්ධන ටැංකිවල ගබඩා කරනු ලබයි

- අඩු සල්ෆර් ඉන්ධන (LSFO)
- නාවික ඩීසල් (MGO)

2022 වර්ෂයේ පැටවීම් පිළිබඳ දත්ත විශ්ලේෂණය

පහත වගුව සහ රූප සටහන මඟින් 2022 වර්ෂයේ පැටවීම පිළිබඳ විශ්ලේෂණය පෙන්නුම් කරයි.

නිෂ්පාදිතය	2022 පැටවීම් (මෙ.ටො.)
LSFO 380 Cst	353,502.598
MGO	88,803.146



ඉහත වගුව සහ රූප සටහන අනුව 2022 වර්ෂයේ මුළු පැටවීම් ප්‍රමාණයෙන් 80% ක් LSFO 380 Cst නිෂ්පාදනය වන අතර 20%ක් MGO වෙයි.

2023 වර්ෂයේ පැටවීම් පිළිබඳ දත්ත විශ්ලේෂණය

පහත වගුව සහ රූප සටහන මඟින් 2023 වසරේ පැටවීම පිළිබඳ විශ්ලේෂණය පෙන්නුම් කරයි.

විස්තරය	2023 පැටවීම් (මෙ.ටො.)
LSFO 380	337,123.447
MGO	75,243.343



ඉහත වගුව සහ රූප සටහන අනුව 2023 වර්ෂයේ මුළු පැටවීම් ප්‍රමාණයෙන් 82% ක් LSFO 380 Cst නිෂ්පාදනය වන අතර 18%ක් MGO වෙයි.

2024 වර්ෂයේ පැටවීම් පිළිබඳ දත්ත විශ්ලේෂණය

පහත වගුව සහ රූප සටහන මඟින් 2024 වසරේ පැටවීම පිළිබඳ විශ්ලේෂණය පෙන්නුම් කරයි.

නිෂ්පාදනය	2024 පැටවීම් (මෙ.ටො.)
LSFO 380 Cst	487,642.826
MGO	76,694.246



ඉහත වගුව සහ රූප සටහන අනුව 2024 වර්ෂයේ මුළු පැටවීම් ප්‍රමාණයෙන් 86% ක් LSFO 380 Cst නිෂ්පාදනය වන අතර 14%ක් MGO වෙයි.

පැටවීම් ප්‍රමාණ සංසන්දනය කිරීම:

නිෂ්පාදනය	2022 (මෙ.ටො.)	2023 (මෙ.ටො.)	2024 (මෙ.ටො.)
LSFO 380 Cst	353,502.598	337,123.447	487,642.826
MGO	88,803.146	75,243.343	76,694.246
මුළු ගණන	**442,305.744**	**412,366.790**	**564,337.072**

2024 වර්ෂයේ පැටවීම් පිළිබඳ දත්ත විශ්ලේෂණය

පහත වගුව සහ රූප සටහන මඟින් 2024 වසරේ පැටවීම පිළිබඳ විශ්ලේෂණය පෙන්නුම් කරයි.



ඉහත වගුවට අනුව සම්පූර්ණ පැටවීම් ප්‍රමාණය 2023 වසර සමඟ සසඳන විට 2024 දී මෙ.ටො. 151,970.282 කින් වැඩිවී ඇත්තේ 2023 වසරට වඩා 36.85% ක වර්ධනයක් පිළිබිඹු කරමිනි.
මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (IMO) රෙගුලාසිවලට අනුකූලව විශේෂයෙන් අඩු සල්ෆර් ඉන්ධන සඳහා වැඩි ඉල්ලුමක් ඇති වීම හේතු කොටගෙන කොළඹ වෙළඳපොලේ බංකර ව්‍යාපාරයේ වර්ධනයයි. මෙම අනුකූලතාවය නිසා වෙළඳපලට පුළුල් පරාසයක යාත්‍රා සඳහා පහසුකම් සැලසීමට හැකි විය.
මීට අමතරව, 2023 වසරේ නොවැම්බරයේ ආරම්භ වූ රතු මුහුදේ අර්බුදයට ප්‍රතිචාර වශයෙන්, JCT තෙල් බැංකුවේ විකුණුම්වල සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත.

මූල්‍ය අංශය - මූල්‍ය සමාලෝචනය

මූල්‍ය කාර්ය සාධනය - 2024

පසුගිය වර්ෂ හා සසඳා බැලීමේදී 2024 මූල්‍ය වර්ෂය කැපී පෙනෙන ප්‍රගතියක් සහ සැළකිය යුතු සාර්ථකත්වයක් පෙන්නුම් කරයි. 2024 වර්ෂයේදී JCT ලිමිටඩ් සමාගම සිය ඉහළම ආදායම වන රුපියල් මිලියන 719 ක ආදායමක් වාර්තා කර ඇත. පසුගිය වර්ෂයේ ආදායම වන රුපියල් මිලියන 612 ක ආදායමට සාපේක්ෂව මෙය 18% ක වර්ධනයකි. බදුගෙවීමට පෙර ලාභය රු. මිලියන 347.9 ක් වූයේ, ශුද්ධ ලාභය රු. මිලියන 243.4 ක පවත්වා ගනිමිනි. මෙය පෙර වසරට සාපේක්ෂව 0.19% ක සුළු අඩුවීමකි. මීට අමතරව ආයතනයේ මෙහෙයුම් ලාභය 13% කින් වර්ධනය වී ඇත්තේ පුළුල් මෙහෙයුම් කාර්යක්ෂමතාවක් පිළිබිඹු කරමිනි. මූල්‍ය පිරිවැය 50%කින් පහත වැටී ඇත්තේ සමස්ත මූල්‍ය වර්ධනයට දායකත්වය සපයමිනි. කොටසක සාපේක්ෂ ඉපයීම් ස්ථාවරව පැවති ඇත්තේ අඛණ්ඩ කාර්ය සාධනයක් පෙන්නුම් කරමිනි. කෙසේ වුවද පොලී අනුපාතයන්හි පහත වැටීම සහ නොගෙවන ලද ණය පියවීම් මූලික කොට ගෙන මූල්‍ය ආදායමෙහි පහත වැටීමක් දක්නට ලැබේ.

2024 වර්ෂය තුළදී සමාගම වාසිදායක මූල්‍යමය තත්වයක් අත්පත් කර ගෙන ඇත



පසුගිය වසර පහ තුළ සමාගමේ මූල්‍ය ප්‍රගතිය පහත වගුවෙන් දැක්වේ

වර්ෂය	2020	2021	2022	2023	2024
ආදායම	210,560,557	297,763,569	608,028,143	612,328,282	719,870,640
දළ ලාභය	87,521,475	163,978,255	415,846,116	384,757,547	431,564,505
මෙහෙයුම් ලාභය	1,695,868	63,858,028	289,387,021	240,923,072	273,552,905
ශුද්ධ ලාභය	12,595,879	65,452,487	245,611,516	243,875,173	243,415,111

2020 - 2024 වර්ෂවල වාර්තා කරන ලද ආදායම සහ ශුද්ධ ලාභය පහත දැක්වෙන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරයි.



පහත අනුපාත විශ්ලේෂණය මගින් 2023 සහ 2024 වර්ෂ තුළ සමාගමේ මූල්‍ය තත්වයෙහි වාසිදායකබව පෙන්නුම් කරයි.

		2024	2023
1.	දළ ලාභ ආන්තිකය	**59.95%**	**62.84%**
2.	ශුද්ධ ලාභ ආන්තිකය	**33.81%**	**39.82%**
3.	යොදවන ලද ප්‍රාග්ධනය මත ඉපයීම	**24%**	**24%**
4.	ජංගම අනුපාතය	**8:1**	**5:1**
5.	තෝලනය	**13%**	**29%**
6.	කොටසකට ඉපයීම	**2434.15**	**2438.75**

2024 වර්ෂයේදී පසුගිය වර්ෂ වලට සාපේක්ෂව සමාගම මූල්‍ය කාර්ය සාධනයෙහි ඉහළ තත්වයක් අත්පත් කර ගෙන ඇත. 2023 වර්ෂයට සාපේක්ෂව දළ ලාභය සහ මෙහෙයුම් ලාභය පිළිවෙලින් 12%කින් සහ 13% කින් වර්ධනය වී ඇත. මූල්‍ය ආදායම මෙම වර්ෂයේදී පහත වැටුනද සමාගම එහි ශුද්ධ ලාභය 2023 මට්ටමේ පැවති තත්වයේම පවත්වා ගෙන යාමට සමත් විය. සමාගමේ මුදල් සහ ඒ හා සමාන වත්කම් ඇතුළත්ව එහි මුලු වත්කම් වර්ධනය කරමින් සිටින අතර එය ශක්තිමත් ද්‍රවශීලතාවක් පිළිබිඹු කරයි. සමාගම එහි ආයෝජන අනුපාත ROE-22% සහ ROCE-30% වශයෙන් සාර්ථක ලෙස කළමනාකරණය කර ඇත.

3. ඉංජිනේරු අංශය

එන්ජින් පොම්ප, ඉන්ධන ගබඩා ටැංකි, බොයිලේරු, ජෙනරේටර්, ඉන්ධන බෙදා හැරීමේ නළ මාර්ග, ගොඩනැගිලි, වාහන සහ වෙනත් යන්ත්‍ර සහ උපකරණ නඩත්තු කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉංජිනේරු අංශය විසින් දරනු ලබයි. එසේම මෙම අංශය මගින් පිරිසැකසුම් කටයුතු, සිවිල් ඉංජිනේරු සහ විදුලිය සම්බන්ධ කටයුතු, ගිනි ආරක්ෂණ සහ ඉන්ධන ගබඩා පර්යන්තයේ අංගන නඩත්තුව යන කටයුතුද සිදු කරනු ලබයි.

<u>ඉංජිනේරු අංශය</u>

ඉංජිනේරු අංශය ක්‍රියාත්මක වනුයේ ඉංජිනේරු ප්‍රධානියා යටතේය. දෛනික නඩත්තු කටයුතු, පිරිසැකසුම් කටයුතු සිදු කිරීමට සහ ටර්මිනල් ගින්නෙන් සහ අනෙකුත් අනතුරුදායක අවදානම් තත්ව වලින් ආරක්ෂා කිරීමට ඉංජිනේරු අංශය තුළ එක් විධායක නිළධාරියෙක්, රාජකාරි කිහිපයක් ඉටුකරනු ලබන තාක්ෂණික ශිල්පීන් (යාන්ත්‍රික) දෙදෙනෙක්, රාජකාරි කිහිපයක් ඉටු කරනු ලබන තාක්ෂණික ශිල්පීන් (සිවිල්) දෙදෙනෙක්, බොයිලේරු ක්‍රියාකරවන්නන් දෙදෙනෙක්, විදුලි කාර්මික ශිල්පීන් දෙදෙනෙක්, එක් ප්‍රධාන ගිනි නිවන නිළධාරියෙක් සහ ගිනි නිවන නිළධාරීන් අට දෙනෙක් සේවය කරති. භූමි අලංකරණය, අංගන නඩත්තුව සහ සනීපාරක්ෂක කටයුතු සිදු කරනු ලබන්නේ ඉංජිනේරු අංශය යටතේය. ප්‍රවාහන අංශය පවතින්නේද ඉංජිනේරු අංශය යටතේ වන අතර ස්ථිර කාර්ය මණ්ඩලය යටතේ රියදුරන් 09 දෙනෙක් සේවය කරති.

එන්ජින් පොම්ප, ඉන්ධන ගබඩා ටැංකි, බොයිලේරු, ඉන්ධන බෙදා හැරීමේ නළ මාර්ග, ගොඩනැගිලි, වාහන සහ වෙනත් යන්ත්‍ර සහ උපකරණ නඩත්තු කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉංජිනේරු අංශය විසින් දරනු ලබයි. එසේම මෙම අංශය මගින් සියළුම පිරිසැකසුම් කටයුතු, සිවිල් ඉංජිනේරු සහ විදුලි ඉංජිනේරු කටයුතු, ඉන්ධන ගබඩා පර්යන්තයේ ගිනි ආරක්ෂණ කටයුතු, අංගන නඩත්තුව ආදී කටයුතු සිදු කරනු ලබයි.

2023-2024 කාලය තුළ සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘති

අ) MGO සඳහා එන්ජිම ක් මගින් ධාවනය වන පොම්පයක් සැපයීම සහ ස්ථාපනය කිරීම

නාවික ඉන්ධන තෙල් (MGO) බංකර් **බාජ්** වෙත පැටවීමේ කාර්යය සඳහා එන්ජින් මගින් ධාවනය වන පොම්ප ඒකක දෙකක් (02) JCT ලිමිටඩ් සතුව දැනට ඇත. එක් එන්ජින් පොම්ප ඒකකයක් 2011 වසරේදී ස්ථාපනය කර ඇති අතර එය හොඳ ධාවන තත්වයේ ඇත. දෙවැන්න අවුරුදු 35 ට වඩා පැරණි අතර හොඳ ධාවන තත්වයේ නැත.

ඉහත තත්ත්වය සැලකිල්ලට ගනිමින් එන්ජින් මගින් ධාවනය වන නව පොම්ප ඒකකයක් සැපයීමට සහ ස්ථාපනය කිරීමට කළමනාකාරිත්වය විසින් තීරණයක් ගෙන ඇති අතර නාවික ඉන්ධන තෙල් (MGO) බංකර් බාර්ජ් වෙත බාධාවකින් තොරව පැටවීම සඳහා එන්ජින් මගින් ධාවනය වන නව පොම්ප ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා 2021, 2022 සහ 2023 වසරවලදී අවශ්‍ය අයවැය ප්‍රතිපාදන වෙන් කරන ලදී. විවිධ බාධාවන් නිසා එය 2023 වසර වන තෙක් සිදු නොවීය. කෙසේ වෙතත් නාවික ඉන්ධන තෙල් පැටවීමේ කාර්යය සඳහා එන්ජින් මගින් ධාවනය වන පොම්පය සැපයීම, සවි කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු නිෂ්පාදන නියෝජිතයෙකු රජයේ ටෙන්ඩරය හරහා තෝරාගෙන 2024 ජූලි මාසයේදී ස්ථාපනය අවසන් කරන ලදී.

(ආ) මෙට්‍රික් ටොන් 12000ක ධාරිතාවයකින් යුත් ටැංකි දෙකක් ඉදි කිරීම

කොළඹ වරායේ මුළු බංකර් ඉන්ධන පරිමාව මසකට මෙ.ටො. 55,000 - 60,000 අතර සාමාන්‍යයක පවතී. JCT සමාගමේ ලියාපදිංචි ඉන්ධන පිරවුම් බලපත්‍රධාරීන් (BLH) කොළඹ ඉන්ධන බැංකුවේ ගබඩා ධාරිතාව වැඩි කරන මෙන් දිගින් දිගටම ඉල්ලීම් සිදු කර ඇත.

ඉදිරි වසරවලදී අපේක්ෂිත ඉල්ලුම ඉහළ යාම හේතුවෙන්, 2020 සැප්තැම්බර් 18 වැනි දින පැවති රැස්වීමේදී තාක්ෂණික කමිටුවක් පිහිටුවීමට මණ්ඩලය තීරණය කළේය. මෙම කමිටුවට JCT Ltd සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) හි නිලධාරීන් ඇතුළත් වන අතර, අවශ්‍ය පියවරයන් ගැනීමේ වගකීම කමිටුවට පැවරී ඇත.

කමිටුව විසින් නව ඉන්ධන ගබඩා ටැංකි දෙකක් ඉදිකිරීම සඳහා භූමි ප්‍රදේශයක් තෝරා ගත් අතර, එක් ටැංකියක ධාරිතාව මෙට්‍රික් ටොන් 12,000 කි. තෝරාගත් ස්ථානයේ පාංශු පරීක්ෂණයක් පවත්වන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලි බල මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, ආරක්ෂක අමාත්‍යාංශය, සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය, කොළඹ මහ නගර සභාවේ ගිනි නිවන දෙපාර්තමේන්තුව සහ **වැසි** ජල අංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු අදාළ අංශයන්හි බලධාරීන්ගෙන් අවශ්‍ය සියලුම අනුමැතිය සහ නිෂ්කාශන ලබා ගන්නා ලදී. සංවර්ධන බලපත්‍රය නිකුත් කරමින් නාගරික සංවර්ධන අධිකාරිය ද ව්‍යාපෘතිය අනුමත කර ඇත.

<u>බ්ලූමැන්ඩල් තෙල් පර්යන්තයේ ගිනි ආරක්ෂණ පද්ධතිය.</u>

1. ගිනි නිවීම් පෙරහුරු අභ්‍යාස

• SLPA, CMC සහ JCT ආයතනවල ගිනි සහ ආරක්ෂක නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2024 වර්ෂයේදී සාර්ථක ඒකාබද්ධ ගිනි නිවීම් පෙරහුරු දෙකක් පවත්වන ලදී.

2. <u>ගිනි නිවීම් සහ ප්‍රථමාධාර පිළිබඳ උසස් මට්ටමේ පුහුණු වැඩසටහන්</u>

ශාන්ත ජෝන්ස් ගිලන් රථ සංගමය සහ කොළඹ මහ නගර සභා (CMC) ගිනි සහ මුදවාගැනීම් පුහුණු ආයතනය මඟින් ගිනි නිවීම් හා ප්‍රථමාධාර පිළිබඳ උසස් මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට පියවර ගෙන තිබුණි.

4. නීති හා මානව සම්පත් අංශය

සීමාසහිත ජය කන්ටේනර් ටර්මිනල්ස් හි සේවක ජීවන චක්‍රයේ කළමනාකාර මණ්ඩලය ලෙස නීති සහ මානව සම්පත් අංශය නව ප්‍රවණතා සහ තාක්ෂණයන්ට අනුගත වෙමින් ආයතනික ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තම කණ්ඩායමේ සාමාජිකයන් ඵලදායීව සහ කාර්යක්ෂමව යොදා ගනිමින් උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීමට කැපවී සිටී.

මානව සම්පත්

2024.12.31 දිනට අංශයේ ප්‍රධානියා, විධායක, පුද්ගලික ලේකම් වරු 1 ක්, ලිපිකරුවන් 3ක්, කළමනාකරණ සහකාර 01ක් සහ කාර්යාල සහායක 07 දෙනෙකුගෙන් මෙම අංශය සමන්විත වේ. මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ කුලී පදනම මත සේවය ලබා ගැනීම, සමාගමේ බඳවා ගැනීම් සහ ආයතනික උපාය මාර්ග සංවර්ධනය කිරීම, ප්‍රතිලාභ සහ වන්දි අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම, ගැටුම් කළමනාකරණය, ආයතනික සන්නිවේදනය කළමනාකරණය කිරීම සහ වැඩි දියුණු කිරීම, සේවක කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම, ආයතනික සංස්කෘතිය කළමනාකරණය කිරීම, පැමිණීම් සහ නිවාඩු වාර්තා තබා ගැනීම, වැටුප් සකස් කිරීම සඳහා මූල්‍ය අංශයට නියමිත වේලාවට වාර්තා ලබා දීම, ආරක්ෂිත සහ සියලු දෙනා ඇතුළත් සේවා පරිසරයක් නිර්මාණය කිරීම, සේවක සුභසාධන පහසුකම් ආරම්භ කිරීම, EPF / ETF සඳහා ලියකියවිලි සකස් කිරීම, සේවක පුහුණුව සඳහා අවශ්‍ය කටයුතු සැලසීම, නීතිමය කටයුතු හැසිරවීම යනාදිය වේ. 2024.12.31 දිනට සමාගමේ මුළු ශ්‍රම බලකාය 98 ක් විය. 2024 වර්ෂය තුළ මරණ 01 ක් සහ ඉල්ලා අස්වීම් 02 ක් වාර්තා වී ඇත.

වන්දි සහ ප්‍රතිලාභ

JCT Limited හි සේවකයින්ට වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය යටතේ රෝහල්ගත ප්‍රතිකාර සඳහා රු. 200,000 දක්වා උපරිමයකට යටත්ව අනෙකුත් පවුලේ සාමාජිකයින් 03 දෙනෙකුට ප්‍රතිලාභ ලැබෙන පරිදි නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට වරප්‍රසාද ඇත. 2024 වර්ෂය තුළ රෝහල්ගත ප්‍රතිකාර ලබා ගත් සේවක සේවිකාවන් වෙනුවෙන් රුපියල් 5,315,584 ක මුදලක් ද ඊට අමතරව වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතිපූරණය සඳහා රුපියල් 969,477.67ක් ද, වෛද්‍ය පරීක්ෂණ ප්‍රතිපූරණය සඳහා රුපියල් 699,324.50ක් ද, ඇස් කණ්ණාඩි සඳහා රුපියල් 150,000.00 ක මුදලක් ද ගෙවා ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෛද්‍ය මධ්‍යස්ථානයෙන් ප්‍රතිකාර ලබා ගැනීමට සේවකයන්ට අවසර දී ඇති අතර, බ්ලූමැන්ඩල් පර්යන්තයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරිය දක්වා ප්‍රවාහන පහසුකම් සපයා ඇත. ඒ අනුව රු. 7,134,386.27 ක මුදලක් 2024 වර්ෂය තුළ සේවකයින් සඳහා වෛද්‍ය පහසුකම් සැපයීම වෙනුවෙන් දරන ලදී.

සමාගමේ සියලුම සේවකයන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙතින් ලබාගන්නා ලද පැය 24ම ආවරණය වන පුද්ගලික අනතුරු රක්ෂණයකින් ආවරණය වන අතර එමගින් කම්කරු වන්දි පනත යටතේ හිමිකම් ද ආවරණය කරනු ලබයි.

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සේවකයකුගේ / පියාගේ / මවගේ / මාමණ්ඩියගේ / නැන්දම්මාගේ මරණයක් සඳහා මුළු රුපියල් 435,000.00 ක මුදලක් ගෙවනු ලැබේ. තවද, සියලුම ස්ථිර සේවකයන්ගේ දරුවන්ට විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මූල්‍ය ආධාර ලබා ගැනීමට හැකියාව ලැබේ.

පුහුණු වැඩ සටහන්

නීති සහ මානව සම්පත් අංශය විසින් 2024 වර්ෂය තුළ සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් සංවිධානය කළ අතර බාහිර පුහුණු වැඩසටහන් සඳහාද සේවකයින් යොමු කරන ලදී. ඒ අනුව 2024 වර්ෂය තුළදී වැඩසටහන් 11ක් සඳහා සේවකයින් 36 දෙනෙකු සහභාගී වූ අතර කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම සහ දිරිගැන්වීම තුළින් සමාගම සඳහා ඔවුන්ගේ උපරිම දායකත්වය ඵලදායී ලෙස සැපයීම සහතික කිරීමට අප සමත් වී ඇත. ඉදිරියේදී තවත් පුහුණු සැසි පැවැත්වීමට නීති හා මානව සම්පත් අංශය අපේක්ෂා කරයි.

වැටුප් ලේඛනය

සමාගමේ මාසික වැටුප් ලේඛනය පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලුම වාර්තා සහ විස්තර නියමිත වේලාවට මුල්‍ය අංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ආයතනික පාලනය

ආයතනික පාලනය යනු සියළුම පාර්ශවකරුවන්ගේ පොදු යහපත උදෙසා සංවිධානයේ සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ආයතනය මෙහෙයවීම සහ පාලනය සඳහා ආයතනය විසින් ස්ථාපනය කරනු ලබන යාන්ත්‍රණයයි. යහපාලනය සඳහා මූලික වගකීම සමාගමේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. අධ්‍යක්ෂ මණ්ඩලය සිය සමාගම්වල පාලනය සඳහා වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් අතරට සමාගමේ උපායමාර්ගික අරමුණු සැකසීම, ඒවා ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය සැපයීම, ව්‍යාපාරයේ කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ එහි භාරකාරත්වය පිළිබඳව කොටස් හිමියන්ට වාර්තා කිරීම ඇතුළත් වේ.

සමාගමේ පාලනය සඳහාද අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. යහපත් භාවිතයන් තහවුරු කිරීම සඳහා සමාගම විසින් නීති සහ රෙගුලාසි, ව්‍යුහයන් සහ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කරයි.

2023 මූල්‍ය වර්ෂය තුළ යහපත් ආයතනික පාලන පිළිවෙත් පිළිබඳ මූලධර්ම භාවිතා කිරීම පිණිස සමාගම විසින් යොදා ගෙන ඇති ක්‍රමවේද සඳහා ඉවහල් වූයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ආයතනික තීරණ, මහා භාණ්ඩාගාරය සහ වරාය සහ නාවික අමාත්‍යාංශය විසින් ලබා දී ඇති නියෝග පිළිපැදීම මගින් විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණක විසින් කරන ලද විමර්ශනය සහ ව්‍යවස්ථාපිත හා නීතිමය අවශ්‍යතාවලට අනුකූල වීම යන කාරණා වේ.

විගණන කමිටු වාර්තාව

"මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය, නෛතික හා නියාමන අවශ්‍යතාවන් සඳහා අනුකූලතාව, බාහිර විගණන සහ සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රමාණවත්බව සහ කාර්යසාධනය යන කාර්යයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණ වගකීම් සපුරාලමින් සිය වගකීම් ඉටුකිරීමේදී මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ."

විගණන කමිටුවේ පරමාර්ථ

විගණන කමිටුව පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ කමිටුවකි. විගණන කමිටු වාර්තාව යනු ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට සහ එහි අධීක්ෂණ වගකීම ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරනු ලබන නිර්දේශ වේ.

විගණන කමිටුවේ කාර්ය භාරය

විගණන කමිටුවේ ප්‍රධාන වගකීම වන්නේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, පවතින අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය, නියාමන සහ ව්‍යවස්ථාපිත අනුකූලතාවය සහ අධිකාරියේ මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව වැනි ක්ෂේත්‍රවල එහි අධීක්ෂණ රාජකාරි ඉටු කිරීමේදී මණ්ඩලයට සහාය වීමයි.

කමිටුව විසින් බාහිර විගණක වාර්තාව සහ විමසුම් පිළිබඳ අදහස් සහ නිරීක්ෂණ ඇගයීමට ලක් කිරීම සහ සාකච්ඡා කිරීම සිදු කරනු ලබයි. අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රමාණවත්භාවය සහ කාර්ය සාධනය ද කමිටුව විසින් තක්සේරු කරනු ලැබේ. ඊට අමතරව අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලද වාර්තාව සහ විමසීම් ඇගයීමට ලක් කිරීම ද සිදු කරනු ලබයි.
විගණන කමිටුවට අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම විමර්ශනයක් සිදුකිරීමටත්, ඉහත සඳහන් කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සියලු අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියා පටිපාටි, අනුකූලතා වාර්තා, අවදානම් කළමනාකරණ වාර්තා ආදිය සමාලෝචනය කිරීමටත් බලය ඇත.

විගණන සහ කළමනාකරණ කමිටුවේ සංයුතිය සහ පැමිණීම

විගණන හා කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂ වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන සහ නියාමක විසින් දක්වා ඇති සංයුතිමය අවශ්‍යතාවන්ට අනුකූලවේ. පැමිණීම සහ අධ්‍යක්ෂවරුන්ගේ තත්වය පහත වගුවේ දක්වා ඇත

නම	තත්වය	සාමාජිකත්වය	පැමිණීම
සී. ඩබ්ලිව්. කේ ධර්මසේන මහතා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (භාණ්ඩාගාරික නියෝජිත)	සභාපති	2/2
බී. ආර්. එල්. ගුණවර්ධන මහතා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	සාමාජික	2/2
එල්.ඒ පණ්ඩුක පෙරේරා මහතා	විගණන අධිකාරී (විගණකාධිපතිවරයාගේ නියෝජිත)	නිරීක්ෂක	2/2
අචලා පෙරේරා මිය	ප්‍රධාන අභ්‍යන්තර විගණක (වරාය, නාවික හා ගුවන්කටයුතු අමාත්‍යාංශය)	නිරීක්ෂක	2/2

ආරාධනය මත නිතිපතා සහභාගිවන්නන්
කළමණාකාර අධ්‍යක්ෂ සහ අංශ ප්‍රධානීන්, කමිටුවේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් - JCT Ltd.

2024 වසරේ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශය

2024 දී විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පහත අවධානය යොමු කරන ක්ෂේත්‍ර යටතේ සාරාංශ කර ඇත

මූල්‍ය වාර්තාකරණය සහ නියාමන අනුකූලතාවය

සමාගමේ ගිණුම් වාර්තාවලට අනුව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ඇතුළු නියාමන ප්‍රතිපාදනවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව තහවුරු කිරීම සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ක්‍රියාකාරීත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්ම පිළිබිඹු කිරීම තහවුරු කිරීම සඳහා විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කරයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ භාවිතයන් යෝග්‍ය සහ ප්‍රමාණවත් බවට විගණන කමිටුව සෑහීමකට පත් වූ අතර විශ්වාසදායක සහ කාලෝචිත තොරතුරු සැපයීමට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය ඵලදායි බවට සහ මනාව කළමනාකරණය කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලන සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ.

01. රැස්වීම්:

විගණන කමිටුව විසින් වර්ෂය තුළ රැස්වීම් දෙකක් (2) පවත්වන ලදී. මෙම සෑම රැස්වීමක් සඳහාම කමිටු සාමාජිකයින්ගේ පැමිණීම ඉහත වගුවේ දක්වා ඇත. සමාගමේ බාහිර විගණක වන රජයේ විගණකගේ නියෝජිතයින් ද නිරීක්ෂකයෙකු ලෙස ලද ආරාධනයෙන් රැස්වීම් 2 කට සහභාගී වූහ. කමිටුව සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට ද රැස්වීම්වලට සහභාගි වන ලෙස අවශ්‍යතාව අනුව වරින් වර ආරාධනා කළේය.

02. අභ්‍යන්තර විගණනය, අවදානම් සහ පාලනය

කමිටුව අභ්‍යන්තර විගණන කාර්යයේ ඵලදායීතාව අධීක්ෂණය කරන අතර සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාව තහවුරු කිරීමේ වගකීම දරයි.

වර්ෂය තුළ, කමිටුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර වෙනස්කම් නිර්දේශ කරන ලද අතර, ප්‍රගතිය නිරන්තරව අධීක්ෂණය කරන ලදී.

අභ්‍යන්තර විගණනයට ප්‍රධාන කාර්යාලයේ සියලුම කාර්යයන් මෙන්ම දකුණු ජැටියේ සියලුම ක්‍රියාකාරකම් ඇතුළත් වන අතර අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව, සඵලතාවය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ ඇගයීමක් මෙන්ම මෙහෙයුම් සහ ව්‍යාපාරික අවදානම් අවම කිරීමට ගන්නා ක්‍රියාමාර්ගද ඇතුළත් වේ. ඊට අමතරව, අභ්‍යන්තර විගණන නිරීක්ෂකයින් සහ ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාගමේ ගිණුම්කරණ සහ මෙහෙයුම් ප්‍රතිපත්තිවලට අනුකූල වීම පිළිබඳ වාර්තා. අභ්‍යන්තර විගණන නියෝජිතයින් විගණන කමිටු රැස්වීම්වලදී ඔවුන්ගේ විගණන වාර්තා සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන විට පැමිණ සිටිති.

අභ්‍යන්තර විගණන කාර්යය ස්වාධීන බවත්, එහි විගණන කටයුතු අපක්ෂපාතීව, නිපුණතාවයෙන් සහ වෘත්තීය සැලකිල්ලෙන් යුතුව සිදු කරන බවට කමිටුවට සහතික විය.

කමිටුව වාර්ෂිකව අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය සහ එයට අයත් සම්පත් ඇගයීමට ලක් කරයි. ප්‍රගතිය, ප්‍රධාන විගණන සොයාගැනීම් සහ ප්‍රතිඵල වලින් සමන්විත අභ්‍යන්තර විගණන උපායමාර්ගය විසින් සීමාසහිත ජය බහාලුම් පර්යන්ත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශය ලබා දෙනු ඇත.

03. බාහිර විගණනය

අතුරු හා අවසාන විගණනයෙන් පැන නගින අදාළ සියලු කරුණු සහ එයට කළමනාකාරීත්වය දක්වන ලද ප්‍රතිචාර සමඟ සාකච්ඡා කරන ලදී.

විගණන සොයාගැනීම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශයක් ඉදිරිපත් කරන ලදී.

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශන
2024 දෙසැම්බර් 31

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAS/C/JCTL/1/2024/01 — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date 2025 ජුනි 12 දින

සභාපති

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මූල්‍ය වාර්තාකරණ සඳහා සංකල්පනාත්මක රාමුවෙහි 2.34 අනුව මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කරන තොරතුරු පැහැදිළිව තේරුම්ගත හැකි වන පරිදි වර්ග කිරීම, ඉදිරිපත් කිරීම හා ගුණාංගීකරණය කල යුතුය. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) හි 27 වන වගන්තිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැර අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට පිළියෙල කල යුතුය. ඒ අනුව කාලච්ඡේදයට අදාළ ස්ථාවර තැන්පතු පොළිය උපචිත පදනමට අයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනාගෙන තිබුණු අතර, ලැබිය යුතු පොළී ආදායම්, ස්ථාවර තැන්පතුවල අයෝජනය කිරීම් සහ ස්ථාවර තැන්පතු ඉවත්කර ගැනීම් කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුළ ගැලපිම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනයවූ මුදල් ප්‍රවාහය රු.28,193,418 කින් අඩුවෙන් වාර්තා කර තිබූ අතර අයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනයවූ මුදල් ප්‍රවාහය රු.28,193,418 කින් වැඩියෙන් වාර්තාකර තිබුණි .

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) හි 117 වන ඡේදය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 (SLFRS 16) හි 53 (a) වගන්ති ප්‍රකාරව ආයතනයක් විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන මිනුම් පදනම් පිළිබඳ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කල යුතු අතර කල්බදු ගැනුම්කරු විසින් භාවිත අයිතිය මත වත්කම්වල ක්ෂය වටිනාකම අදාල වත්කම් පන්තිය යටතේ අනාවරණය කල යුතුය. නමුත්, සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති අංක 2.3.9. හි භාවිත අයිතිය මත පවතින රු.42,725,000 වටිනා මෝටර් රථ වලට අදාල වන රු.3,450,861 ක් වූ ක්ෂය වටිනාකමට අයත් ක්ෂය අනුපාතය හෝ ඵලදායි ජීවකාලය අනාවරණය කර නොතිබුණු අතර ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ වෙන් වෙන්ව හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 (LKAS 07) හි 07 වන ඡේදය අනුව සාමාන්‍යයෙන් මුදල් හා මුදල් සමාන දෑ ලෙස වර්ග කිරීමට සුදුසුකම් ලබනුයේ ආයෝජන මිලට ගත්/ අත්පත්කරගත් දින සිට කෙටිකාලින පරිණතවීමක්, එනම් මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් තුළදී පරිණත වන ආයෝජන වේ. නමුත් සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ මුදල් හා මුදල් සමාන දෑ ලෙස හෙළිදරව් කර ඇති වටිනාකම තුළ රු. 77,398,510 ක් වටිනා මාස 6 ට පසු පරිණත වන ස්ථාවර තැන්පතු 02 ක් වාර්තාකර තිබුණු බැවින් එම වටිනාකමින් මුදල් හා මුදල් සමාන දෑ වැඩියෙන් දක්වා තිබූ අතර ස්ථාවර තැන්පතු එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (LKAS 08) හි 39 වන ඡේදය අනුව ආයතනයක් විසින් ප්‍රවර්තන වර්ෂය සහ අනාගත කාලයක් සඳහා බලපාන ගිනුම්කරණ ඇස්තමේන්තුවල වෙනස් කිරීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකල්පනාත්මක

රාමුවෙහි 2.34 අනුව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කරන තොරතුරු පැහැදිලි සහ සංක්ෂිප්තව ඉදිරිපත් කල යුතුය. නමුත් සමාගම විසින් 2024 වර්ෂය තුල ඵලදායි ජීව කාලය නැවත සංශෝධනය කල රු. 9,426,487.96 ක ලී බඩු සහ උපකරණ හා යන්ත්‍රෝපකරණ අයිතම 04 ක් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් නොකිරීම හේතුවෙන් පරිශීලකයන්හට සමාලෝචිත වර්ෂය තුළ ඵලදායි ජීව කාලය සංශෝධනය කල වත්කම් හදුනාගත නොහැකි විය.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 (LKAS 16) හි 7b අනුව වත්කම් හඳුනාගැනීම සඳහා ඒවායේ පිරිවැය නිශ්චිතව තක්සේරුකර ගත හැකිවිය යුතුය. නමුත් වත්කම් සත්‍යාපන කමිටුව (Asset Verification Committee) විසින් භෞතිකව පරීක්ෂාවේදී නිරීක්ෂණය කර ගත නොහැකි සහ කළමනාකරණයට අනුව පිරිවැය වෙන් වෙන්ව හදුනා ගැනිමට නොහැකි බවට සඳහන් පිළිවෙලින් රු.492, 216 ක් සහ රු.1,540,035 ක් වූ ලී බඩු හා උපකරණ සහ පරිගණක හා උපාංග යන වත්කම් මූල්‍ය ප්‍රකාශනතුල වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි

ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) අංක 25/2022 දරන සමාජ ආරක්‍ෂණ දායකත්ව බදු පනත	සමාජ ආරක්‍ෂණ දායකත්ව බදු පනතේ පළමු උපලේඛණයේ ii වන කොටසේ අයිතම 04 යටතේ තෙල් පොම්ප කිරීමේ ගාස්තු බදු නිදහස් සේවාවක් ලෙස සැලකිය නොහැකි බව දක්වා ඇතත් 2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා, 2023 වර්ෂය සහ 2024 ජනවාරි සිට දෙසැම්බර් 10 දක්වා පිළිවෙලින් රු.115,462,139ක්, රු.420,136,784ක් හා රු.499,685,324 ක් වූ තෙල් පොම්පකිරීමේ ගාස්තුව මත අයකල යුතු සමාජ ආරක්ෂණ බද්ද පිළිවෙලින් රු. 2,960,568ක් රු. 10,772,738ක් හා රු.12,812,393 ක් වේ. එබැවින් මෙම කාලයන්ට අදාළ මුළු සමාජ ආරක්ෂණ බද්ද වන රු.26,545,699 ක බදු මුදලක් අයකර ගැනීමකින් තොරව ඉන්වොයිස් කර ඇති බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එම බදු මුදල ප්‍රේෂණය කිරීමට නොහැකි වී තිබුණි.
(ආ) 1954 අගෝස්තු 9 දිනැති අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ I කොටසේ 3 වන වගන්තිය	යම් ආයතනයක සේවකයන් වැඩමුර ක්‍රමයට සේවයේ යොදවයි නම් දිනකට උපරිම පැය 8 කට හා සතියකට පැය 45 කට සීමා විය යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස සමාගම විසින් 2024 වර්ෂයේදී මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ සේවකයින් 47 දෙනෙකු පැය 24 ක අඛන්ඩ වැඩමුර සඳහා සේවයේ යොදවා තිබුණු අතර සේවය ලබාගෙන තිබුණේ සතියකට දින 02ක් පමණි.

(ඇ)	2024 ජුලි 26 දිනැති අංක ED/EDR/PRE/2024/6-04B දරන මැතිවරණ කොමිෂන් සභා චක්‍රලේඛයේ 5 වන වගන්තිය, 2024 පෙබරවාරි 28 වන දිනැති අංක 01/2024 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.1 වන වගන්තිය සහ 2023 සැප්තැම්බර් 27 දිනැති අංක 01/2021(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන වගන්තිය	අත්‍යාවශ්‍ය සේවක බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය හා ඡන්ද විමසීම් කාල සීමාව තුළ සිදුකරන පත්කිරීම සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ එකගතාවය ලබාගත යුතු නමුත්, 2024 අගෝස්තු 02 දින මැතිවරණ කොමිෂමේ එකඟතාවයකින් තොරව සේවකයන් බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. එම දිනෙන් පසුව 2024 අගෝස්තු 06 සිදුකළ ඉල්ලීම සඳහා එකඟතාවය ලෙස තාක්ෂණ ගණයේ සේවකයන් 10 ක් බඳවා ගැනීම සඳහා පමණක් එකඟතාවය ලබාදී තිබුණි. නමුත් ඉල්ලුම්කර තිබූ සේවකයන් 12 දෙනාගෙන් 11 දෙනෙකුම තාක්ෂණ ගණයේ නොවන සේවකයන් වූ අතර රු. 56,280 ක වියදමක් දරා ඡන්ද විමසීමේ කාලය තුළ සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණ නමුත් බඳවා ගැනීම් සිදුකර ද නොතිබුණි.
(ඈ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2022 ජනවාරි 14 දිනැති 01/2015 (ii) අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	සංස්ථා, මණ්ඩල හා රජය සතු සමාගම්වල ප්‍රවාහන පහසුකම් ලබාගත හැකි නිලධාරී කාණ්ඩ 03ක් සඳහා පවරා දී ඇති වාහන වෙනුවෙන් මාසිකව ලබාගතහැකි ඉන්ධන සීමාව ඉක්මවා එම නිලධාරී කාණ්ඩ 03 අතර ලීටර් 90ක් ලීටර් 85ක් හා ලීටර් 40 වශයෙන් චක්‍රලේඛයට පටහැනිව ඉන්ධන ලබාගෙන ඇති අතර එම වැඩිවීම සියයට 62, සියයට 59 හා සියයට 30 ක් විය. මේ හේතුවෙන් 2024 වර්ෂය සඳහා රු. 1,212,575 ක් (ලීටර් 3300.56 ක් සඳහා) ඉන්ධන සඳහා වැඩිපුර වැයකර තිබුණි.

(ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත (Operational Manual)

(i)	3.2 (ii) වගන්තිය	සමාගම සඳහා විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් සකස්කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබාගෙන නොතිබුණි.
(ii)	3.3 (ii) වගන්තිය	සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම අනුමත සේවක සංඛ්‍යාව සමග සංවිධාන සටහන සකස් කර තිබිය යුතු වුවත්, සමාගම එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) මානව සම්පත් ක්‍රියාකාරකම් හා වැටුප් ලේඛන සම්බන්ධ කටයුතු අතින් (manual) සිදුවීම හේතුවෙන් කාර්යක්ෂමව හා ඵලදායීව කාර්යය ඉටුකිරීමට ක්‍රමෝපායක් අවශ්‍ය බැවින් 2021 වර්ෂයේ සිට රු.976,000ක් දරා ලබාගත් HR & Payroll පද්ධතිය මේ වන තෙක් ක්‍රියාත්මක කර ගත නොහැකි තත්ත්වයක පැවතීම හා HR & Payroll පද්ධතිය මගින් ලබාගත යුතු අවසාන ප්‍රතිඵලය වන වැටුප් පත්‍රිකා නිවැරදිව මුද්‍රණය කරවා ගැනීමට මේ වනතෙක් අපොහොසත්ව තිබුණු බැවින් දරන ලද වියදමට උපරිම ප්‍රතිලාභයක් ලබාගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) සමාගමේ කාර්යය වන්නේ ගනුදෙනුකරුවන් විසින් ලබා දෙන තෙල් ගබඩා කර, ඔවුන්ගේ ඉල්ලීම පරිදි නැව් සඳහා සපයා ගාස්තු අය කිරීම වේ. ඒ අනුව සමාගම භාරයේ ඇති මෙට්‍රික් ටොන් 1000ක ධාරිතාවයෙන් යුතු අංක 102 දරන තෙල් ටැංකියෙහි 2024 දෙසැම්බර් 31 දිනට 380 (HSFO) ඉන්ධන, Lanka Maritime Services Ltd හි මෙට්‍රික් ටොන් 162.257 ක් ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කර තිබුණි. තවද, එම ආයතනය විසින් මෙම තෙල් නිදහස් කරගෙන නොමැති බැවින් හා 380 (HSFO) ඉන්ධන භාවිතයට නොගන්නා බැවින් වෙනත් ඉන්ධන වර්ගයක් ගබඩා කරගත නොහැකිව 2020 වර්ෂයේ සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්යව පැවතුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

ලාභාලාභ ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

	සටහන්	2024 රු.	2023 රු.
ආදායම	3	**719,870,640**	**612,328,282**
විකුණුම් පිරිවැය	25	(288,306,135)	(227,570,735)
දළ ලාභය		431,564,505	384,757,547
පරිපාලන වියදම්	26	(158,011,600)	(143,834,475)
මෙහෙයුම් ලාභය		**273,552,905**	**240,923,072**
මෙහෙයුම් නොවන ආදායම	3.1	156,712	1,558,899
මූල්‍ය ආදායම	4.1	80,855,363	122,246,510
මූල්‍ය පිරිවැය	4.2	(6,607,812)	(12,534,472)
බදු පෙර ලාභය		**347,957,168**	**352,194,009**
ආදායම් බදු වියදම	14	(104,542,057)	(108,318,836)
බදු පසු ලාභය		**243,415,111**	**243,875,173**
කොටසක ඉපයීම්	16	2,434.15	2,438.75

පිටු අංක 8 සිට 26 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි

අනෙකුත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

	සටහන්	2024 රු	2023 රු
වසර සඳහා ලාභය		243,415,111	243,875,173
අනෙකුත් විස්තරාත්මක ආදායම			
පසු කාලසීමාව තුළ ලාභය හෝ අලාභයට නැවත වර්ගීකරණය කළ යුතු			
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභය)	12	(6,687,680)	1,529,645
වසර සඳහා අනෙකුත් විස්තරාත්මක ආදායම - බද්දෙන් පසු	12	(6,687,680)	1,529,645
වසර සඳහා මුළු අනෙකුත් විස්තරාත්මක ආදායම - බද්දෙන් පසු		**236,727,431**	**245,404,818**

පිටු අංක 8 සිට 26 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2024	2023
වත්කම්		රු	රු
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	5	101,600,678	77,966,586
භාවිතයට අයිතිය ඇති වත්කම්	5	20,783,461	24,234,322
මූල්‍ය වත්කම්			
සේවකයින්ට ලබාදුන් ණය	6.2	38,057,453	35,798,566
		160,441,592	**137,999,474**
අස්පෘශ්‍ය වත්කම්	5.6	854,626	715,583
මෙ.ටො. 3200 ටැංකි හා ගිනි පෙන සඳහා විලම්භිත වියදම්	5	141,741,769	147,148,092
		142,596,395	147,863,675
ජංගම වත්කම්			
අවසාන තොගය		21,655,085	10,989,566
වෙළෙඳ හා අනෙකුත් ලැබීම්	6	113,500,464	123,530,979
අනෙකුත් ජංගම මූල්‍ය වත්කම්	7	597,959,213	564,338,191
මුදල් හා මුදලට සමාන දෑ	8	221,039,245	178,048,250
		954,154,007	876,906,986
මුළු වත්කම්		**1,257,191,994**	**1,162,770,135**
ස්කන්ධය හා වගකීම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	9	1,000,000	1,000,000
රඳවාගත් ඉපයීම්		1,109,625,542	897,898,111
මුළු ස්කන්ධය		**1,110,625,542**	**898,898,111**
ජංගම නොවන වගකීම්			
පොළිය දරන ණය සහ ණය ගැනීම්	10	-	73,897,010
සේවක ප්‍රතිලාභ වගකීම	12	31,099,093	20,015,878
		31,099,093	**93,912,888**
ජංගම වගකීම්			
පොළිය දරන ණය සහ ණය ගැනීම්	10	-	11,301,600
මූල්‍ය කල්බදු බැඳීම	11	-	3,229,777
ගෙවිය යුතු ආදායම් බදු	14	35,511,322	60,490,856
විලම්භිත බදු වගකීම	15	2,607,247	5,473,621
වෙනත් ගෙවීම්	13	77,348,790	89,463,282
		115,467,359	169,959,136
මුළු ස්කන්ධය හා වගකීම්		**1,257,191,994**	**1,162,770,135**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවන බවට මම සහතික කරමි.

....
මූල්‍ය නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීමට බැඳී සිටී. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 8 සිට 26 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

....	....	....
සභාපති	අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ

2025.02.19 - කොළඹ

ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

	සටහන්	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු	රඳවාගත් ඉපයීම් රු	එකතුව රු
2022 ජනවාරි 01 දිනට ශේෂය		1,000,000	680,787,987	681,787,987
වසර සඳහා ලාභය			243,875,173	243,875,173
වසර සඳහා බද්දෙන් ශුද්ධ අනෙකුත් විස්තරාත්මක ආදායම	12		1,529,645	1,529,645
ලාභාංශ			(25,000,000)	(25,000,000)
පෙර වසරේ ගැලපීම			(3,294,694)	(3,294,694)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය		**1,000,000**	**897,898,111**	**898,898,111**
වසර සඳහා ලාභය			243,415,111	243,415,111
වසර සඳහා බද්දෙන් ශුද්ධ අනෙකුත් විස්තරාත්මක ආදායම	12		(6,687,680)	(6,687,680)
ගෙවූ ලාභාංශ			(25,000,000)	(25,000,000)
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය		**1,000,000**	**1,109,625,542**	**1,110,625,542**

පිටු අංක 8 සිට 26 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

	සටහන්	2024 රු	2023 රු
මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
ආදායම් බදු වියදමට පෙර ශුද්ධ ලාභය		347,957,168	352,194,009
ගැලපීම්			
ක්ෂය කිරීම	5.0	17,710,601	15,270,878
ක්‍රමක්ෂය	5.4	5,592,280	5,508,440
ලද පොළිය	4.1	(80,855,363)	(122,246,510)
සේවක ප්‍රතිලාභ වගකීම් සඳහා වෙන්කිරීම	12.0	4,885,610	4,375,582
මූල්‍ය පිරිවැය	4.2	6,607,812	12,534,472
රඳවාගත් ඉපයීම් ගැලපීම		-	(3,294,633)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය		301,898,108	264,342,238
තොගය තුළ (වැඩිවීම)/අඩුවීම		(10,665,510)	(6,335,084)
වෙළෙඳ හා අනෙකුත් ලැබීම්වල /සේවකයින්ට ණය (වැඩිවීම)/අඩුවීම		3,546,677	(16,532,088)
අනෙකුත් ගෙවීම්/ අසම්භාව්‍ය බැරකම්වල (වැඩිවීම)/අඩුවීම		(12,114,492)	14,459,914
අනෙකුත් ජංගම මූල්‍ය වත්කම්වල(වැඩිවීම)/අඩුවීම		(33,621,022)	(166,209,521)
මෙහෙයුම්වලින් උපයන ලද මුදල්		249,043,761	89,725,459
ගෙවූ මූල්‍ය පිරිවැය	4.2	(6,607,812)	(12,534,472)
ගෙවූ ආදායම් බදු		(128,163,023)	(115,751,839)
ගෙවූ සේවක ප්‍රතිලාභ වගකීම	12.0	(490,075)	(2,042,231)
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ		113,782,851	(40,603,083)
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම	5.0	(37,893,832)	(25,811,402)
අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම	5.6	(325,000)	(527,700)
ලද පොලිය	4.1	80,855,363	122,246,510
ආයෝජන කාර්යයන්හි භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහ		42,636,531	95,907,408
මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
පොළිය දරන ණය හා ණයගැනීම් මත ගෙවූ ප්‍රාග්ධනය		(85,198,610)	(11,301,690)
ගෙවූ කල්බදු වාරික		(3,229,777)	(5,018,916)
ගෙවූ ලාභාංශ		(25,000,000)	(25,000,000)
ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ		(113,428,387)	(41,320,606)
මුදල් හා මුදලට සමාන දෑ හී ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		42,990,995	13,983,719
වසර ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ		178,048,250	164,064,531
වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ	8	**221,039,245**	**178,048,250**

පිටු අංක 8 සිට 26 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

1. ආයතනික තොරතුරු

1.1 පොදු කරුණු

ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම 2002 පෙබරවාරි 20 දින 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද සහ, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2008 අප්‍රේල් 25 දින නැවත ලියාපදිංචි කරන ලද ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සීමිත පොදු සමාගමකි. එහි ලියාපදිංචි ලිපිනය කොළඹ 01, පල්ලිය වීදිය, අංක 19 හි පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 15, වෝල්ස් පටුමහ, අංක 69 හි පිහිටා ඇත.

1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළදී සමාගමේ ප්‍රධාන කාර්යය වූයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ තෙල් බැංකුව කළමනාකරණය කිරීමයි.

1.3 මූල්‍ය කාලසීමාව සහ නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2025.02.19 දින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකට අනුකූලව නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද SLFRS සහ LKAS (මෙහි මින්මතු "SLFRS" ලෙස හැඳින්වෙන) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූල වේ.

2.1.2 අගය කිරීමේ පදනම

පහත අවස්ථාවන්වලදී හැර, මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමක් මත පිළියෙල කරනු ලැබ ඇත;

- කල්පිරෙන තෙක් රඳවාගන්නා ලෙස පිළිබිඹු කරන මූල්‍ය උපකරණ සහ ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන ණය හා ලැබීම්.
- නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලබන නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම්.

සුදුසු අවස්ථාවන්හිදී නිශ්චිත ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල පැහැදිලි කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත

2.1.3 අනුකූලතා ප්‍රකාශනය

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමඟ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභාලාභ ප්‍රකාශනය, අනෙකුත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුළත් මූල්‍ය ප්‍රකාශන ("මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත.

2.2 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

SLFRS/LKAS's වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තා වූ ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම කළමනාකරණයට අවශ්‍ය වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ වාතාවරණයන් යටතේ සාධාරණ යැයි සැලකෙන අපේක්ෂාවන් ඇතුළුව වෙනත් සාධක මත පදනම් වේ. එබැවින් සත්‍ය අත්දැකීම සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ක්‍රමානුකූල පදනමක් මත වන්දි ගෙවීමට අදහස් කරන පිරිවැයට ගැලපීම සඳහා අවශ්‍ය කාල සීමාව තුළ ආදායම ලෙස පිළිගත් සංශෝධන.

අ) අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගම සතු හැකියාව සම්බන්ධයෙන් තක්සේරුවක් අධ්‍යක්ෂ මණ්ඩලය සිදුකොට ඇති අතර, දැකිය හැකි අනාගතය සඳහා ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත්වේ. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගම සතු හැකියාව සම්බන්ධයෙන් සැළකිය යුතු සැකයක් ඉපදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරීත්වය දැනුවත් නැත. එමනිසා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම අඛණ්ඩ පැවැත්ම යන පදනම මත සිදු කෙරේ.

ආ) සේවක ප්‍රතිලාභ වගකීම:

නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් උපයෝගී කරගනිමින් ආයුගණක පදනමක් මත තීරණය වන සාධක කිහිපයක් මත රඳා පවතී. නිශ්චිත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම් නිර්ණය කිරීමේදී භාවිතා කෙරෙන ප්‍රධාන උපකල්පන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 12 හි දක්වා ඇත. මෙම උපකල්පනවල යම් වෙනස්වීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ අගය කෙරෙහි බලපායි. .

ඇ) බැඳීම් සහ අසම්භාව්‍යතා

සියළුම දැනුවත් වගකීම්වල ප්‍රමාණය තීරණය කිරීමේදී සියළුම තේරුම්ගත හැකි අවදානම් ගණන් ගනු ලැබේ.

අසම්භාව්‍ය වගකීම් යනු එහි පැවැත්ම අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදු විය නොහැකි හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වර්තමාන බැඳීම් වලින් පමණක් තහවුරු කරනු ලබන විය හැකි බැඳීම් වේ. අසම්භව්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේදී හඳුනා නොගැනෙන නමුත් ඒවා දුරස්ථ වන්නේ නම් මිස හෙළිදරව් කරනු ලැබේ.

2.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.3.1 විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර, එය සමාගමේ ක්‍රියාත්මක සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල වේ. විදේශ මුදල්වලින් සිදු වන ගනුදෙනු එම ගනුදෙනුව සිදු වූ දිනට බලපැවැත්වූ විනිමය අනුපාතිකය මත මූලිකව වාර්තා කෙරේ. විදේශ ව්‍යවහාර මුදලින් දක්වා ඇති මූල්‍ය වත්කම් හා බැරකම් ශේෂ පත්‍රයේ දිනයට පවතින ක්‍රියාත්මත විනිමය අනුපාතිකය අනුව නැවත පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්වීම් ලාභයට හෝ අලාභයට ගනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලකින් ඓතිහාසික පිරිවැය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, මූලික ගනුදෙනු දිනයේදී පවත්නා විනිමය අනුපාතික භාවිත කරමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදලකින් සාධාරණ අගයට මිනුම්කරණය කළ මූල්‍ය නොවන අයිතම, සාධාරණ අගය නිශ්චය කළ දිනයට පවතින විනිමය අනුපාතික භාවිත කරමින් පරිවර්තනය කෙරේ.

2.3.2 බදුකරණය

අ) වර්තන හා විලම්භිත ආදායම් බදු

වර්තමාන හා පූර්ව කාලයන් සඳහා වර්තන ආදායම් බදු වත්කම් හා වගකීම් බදු අධිකාරීන්ගෙන් බදු අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කළ ප්‍රමාණයෙන් මනිනු ලැබේ. ප්‍රමාණ ගණනය කිරීම සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති යනු ශේෂ පත්‍ර දිනය වන විට බලාත්මක කර ඇති හෝ පසුකාලීනව බලාත්මක කරන ලද ඒවා වේ.

ආදායම් බදු සඳහා වන වෙන්කිරීම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති ආදායමේ හා වියදම්වල මූලිකාංග මත පදනම් වන අතර, දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කෙරේ.

2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතට අනුව, බැඳුම්කර ගබඩාවේ ව්‍යාපාර නිශ්චිත ව්‍යාපාරයක අර්ථයට ගැලපේ. එබැවින් නිශ්චිත ව්‍යාපාරයකට අයත් ව්‍යාපාරයකින් ලබන ලාභ සඳහා 2021 දි බදු අයකළ අතර එය ව්‍යාපාර ලාභයෙන් 14% කින්ද මූල්‍ය ආදායමෙන් 24% කින්ද බදු අය කෙරිණි. 2022 වසර තුළ, අදායම් බදු පනතට නව සංශෝධන මත පදනම් වී, පළමු මාස හයේ ව්‍යාපාර ලාභයට 14%කින් සහ මූල්‍ය ආදායමට 24%කින් බදු අයකළ අතර ඉතිරි මාස හය සඳහා 30%කින් බදු අය කරන ලදි. 2023 වසරේ සිට, ව්‍යාපර ලාභය හා මූල්‍ය ආදායම යන දෙකටම 30%කින් බදු අය කරන ලදි.

වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර පැන නගින තාවකාලික වෙනස්වීම් සහ මූල්‍ය ප්‍රකාශනවල ඒවායේ ධාරණ අගයන් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත ආදායම් බද්ද සම්පූර්ණයෙන්ම වෙන් කෙරේ. ශේෂ පත්‍ර දිනය වන විට බලාත්මක කර ඇති හෝ පසුකාලීනව බලාත්මක කර ඇති බදු අනුපාත (සහ නීති) භාවිතා කරමින් විලම්භිත ආදායම් බදු තීරණය කරන අතර, අදාළ විලම්භිත ආදායම් බදු වත්කම් උපලබ්ධි කර ගත් විට හෝ විලම්භිත ආදායම් බදු වගකීම නිරවුල් කරන විට යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

තාවකාලික වෙනස්වීම් භාවිතා කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභයක් ලබා ගත හැකි තාක් දුරට විලම්භිත ආදායම් බදු වත්කම් හඳුනාගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

2.3.3 ආදායම හඳුනා ගැනීම

SLFRS 15- සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලාඒමට ඉඩ ඇති සහ ආදායම සහ ඒ හා සම්බන්ධ දරන ලද හෝ දැරීමට නියමිත පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනා ගනී. ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයේදී ආදායම මනිනු ලැබේ. ආදායම හඳුනා ගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් විශේෂ නිර්ණායක භාවිතා කෙරේ.

අ) තෙල් බැංකුවේ සේවා ගාස්තු ආදායම

තෙල් බැංකු සේවා ගාස්තු ආදායම එක් එක් ලිත් මාසය අවසානයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ එකඟ වූ පරිදි හඳුනා ගනී.

ආ) පොළිය

එකතු කිරීමේ හැකියාව සැක සහිතනම් මිස පොලී ආදායම උපචිත වූ පොලිය ලෙස හඳුනා ගනී. පොලී ආදායම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම යටතේ ඇතුළත් කරනු ලබයි.

ඇ) ලාභාංශ

කොටස් හිමියන්ට ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනී.

ඇ) වෙනත්

වෙනත් ආදායම උපචිත පදනමක් මත හඳුනා ගනී.

දේපල, පිරියත සහ උපකරණ සහ ආයෝජනය ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීම මත ආදායමක ස්වභාවයෙන් ලැබෙන ශුද්ධ ලාභ හා අලාභ බැහැර කිරීමෙන් ලද මුදල, වත්කම්වල ධාරණ අගය සහ අදාළ විකුණුම් වියදම්වලින් අඩු කර ආදායම් ප්‍රකාශයේ ගිණුම් ගත කරනු ලබයි.

ප්‍රධාන ආදායම් උත්පාදන කටයුතුවලට අනියම් කටයුතුවලින් ඇතිවන සහ සමාගමක වැදගත් නොවන සමාන ගණුදෙනුවලින් ඇති වන ලාභ සහ අලාභ එකතු කර ශුද්ධ පදනමක් මත වාර්තා කර ඉදිරිපත් කෙරේ.

2.3.4 ණය ගැනීමේ පිරිවැය

අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට සැලකිය යුතු කාලසීමාවක් අවශ්‍යයෙන්ම ගන්නා වත්කමක් අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම සඳහා ඍජුවම ආරෝපණය කළ යුතු ණය ගැනීමේ පිරිවැය අදාළ වත්කම්වල පිරිවැයේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. අනෙකුත් සියලුම ණය දීමේ පිරිවැය සහ එයට පාදක වූ ඉදිකිරීම නිම කිරීමෙන් පසු දැරූ ණය ගැනීමේ පිරිවැය ඒවා සිදු වන කාලසීමාව තුළ දී ගෙවනු ලැබේ. ණය ගැනීමේ පිරිවැය අරමුදල් ණයට ගැනීම සම්බන්ධව යම් ආයතනයක් දරන පොලී සහ අනෙකුත් වියදම් වලින් සමන්විත වේ.

2.3.5 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසුකාලීන අගය කිරීම

2.3.5.1 මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයක් යනු කිසියම් ආයතනයක මූල්‍ය වත්කමක් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීමක් හෝ ස්කන්ධ උපකරණයක් ඇති කරන ඕනෑම ගිවිසුමකි.

ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම 2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රථම වරට SLFRS 9 - මූල්‍ය උපකරණ යොදා ගෙන ඇත.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

හඳුනාගැනීම සහ පසුකාලීන අගය කිරීම

ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම මූලිකවම උත්පාදනය වන විට “වෙළෙඳ ලැබීම්” හඳුනා ගනී. ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම උපකරණයේ ගිවිසුම්ගත විධිවිධාන සඳහා පාර්ශ්වකරුවෙකු බවට පත්වන විට අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් මූලිකවම හඳුනා ගනී.

වර්ගීකරණය සහ පසුකාලීන අගය කිරීම

ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම විසින් මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලද; අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ වටිනාකම (FVOCI); හෝ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම (FVTPL) ලෙස මූල්‍ය වත්කමක් වර්ගීකරණය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා වන ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ ව්‍යාපාර ආකෘතිය මත රඳා පවතී. ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම විසින් මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වූ සිය ව්‍යාපාරික ආකෘතිය වෙනස් කරන්නේනම් මිස මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය නොකෙරේ. එම අවස්ථාවේදී ව්‍යාපාර ආකෘතියේ වෙනස් වීමෙන් පසු පළමු වාර්තාකරණ කාලපරිච්ඡේදයේ පළමු දිනයේදී බලපෑමට ලක් වූ සියලුම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කෙරේ’

මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමට වත්කම් රඳවා ගැනීම පරමාර්ථය වන ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටින්නේනම් සහ ගිවිසුම්ගත නියමයන් හිඟව පවත්නා මුල් මුදල මත විශේෂ දිනවල මුල් මුදල සහ පොලී පමණක් ගෙවීම් නියෝජනය කරන මුදල් ප්‍රවාහ ඇති කරන්නේනම් සහ මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමට නම් කර නොමැතිනම්, මූල්‍ය වත්කමක් **ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය** කෙරේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් අරමුණ සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටින විට සහ ගිවිසුම්ගත නියමයන් හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී පමණක් ගෙවීම් නියෝජනය කරන විශේෂ දිනවල මුදල් ප්‍රවාහ ඇතිකරන විට, සහ මෙම ණය උපකරණ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කර නොමැති විට, **වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට මිනුම්කරණය** කෙරේ. වෙළෙඳාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජනයක මූලික හඳුනා ගැනීම මත, ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම **වෙනත් විස්තීර්ණ ආදායම තුළ** ආයෝජනයේ **සාධාරණ වටිනාකම** තුළ පසුකාලීන වෙනස්වීම් ඉදිරිපත් කිරීමට වෙනස් කළ නොහැකි සේ තෝරා ගෙන ඇත. මෙම තෝරා ගැනීම ආයෝජනයෙන් ආයෝජනය යන පදනම මත සිදු කෙරේ. ඉහතින් විස්තර කර ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට මනින ලද ලෙස වර්ගීකරණය නොකරන ලද සියලුම මූල්‍ය **වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ** අගයට **මනිනු** ලබයි. මෙයට ස්කන්ධ ආයෝජන සහ ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූලික හඳුනා ගැනීම මත, ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම ආපසු වෙනස් කළ නොහැකි ලෙස ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට හෝ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මැනීමේ අවශ්‍යතාව වෙනත් ආකාරයකින් සපුරාලන මූල්‍ය වත්කමක් නම් කරනු ලැබිය හැකිය. එසේ කිරීම මඟින්, වෙනත් ආකාරයෙන් ඇති විය හැකි ගිණුම්කරණ නොගැලපීමක් සැලකියයුතු ලෙස ඉවත් කිරීම හෝ අඩු කර ගැනීම සිදු කරයි.

පසුකාලීන අගය කිරීම සහ ලාභ සහ අලාභ:

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්
මෙම වත්කම් පසුව සාධාරණ වටිනාකමට මනිනු ලැබේ. පොලී හෝ ලාභාංශ ආදායම ඇතුළුව ශුද්ධ ලාභ හෝ අලාභ ලාභය හා අලාභය තුළ හඳුනා ගනී.

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
මෙම වත්කම් පසුකාලීනව ඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. හානිකරණ අලාභවලින් ක්‍රමක්ෂය පිරිවැය අඩු කරනු ලබයි. පොලී ආදායම, විදේශ විනිමය ඉපයීම් හා අලාභ හා හානිකරණ ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී. බැහැර කිරීම මත ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට ණය උපකරණ
මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයට මනිනු ලැබේ. ඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් ගණනය කරන ලද පොලී ආදායම, විදේශ විනිමය ලාභ හා පාඩු හා හානිකරණ ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී. අනෙකුත් ශුද්ධ ලාභ හා අලාභයන් වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනා ගනී. බැහැර කිරීම මත, වෙනත් විස්තීර්ණ ආදායම තුළ සමුච්චිත වූ ලාභ හා අලාභ, ලාභය හෝ අලාභට නැවත වර්ගීකරණය කෙරේ.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට ස්කන්ධ උපකරණ
මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයට මනිනු ලැබේ. ලාභාංශ ආයෝජන පිරිවැයෙන් කොටසක් ආපසු අයකිරීම පැහැදිලිව නියෝජනය කරන්නේ නම් මිස, ලාභාංශ ලාභය හෝ අලාභය තුළ ආදායම ලෙස හඳුනා ගනී. අනෙකුත් ශුද්ධ ලාභ හා අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගන්නා අතර ඒවා කිසි විටෙක ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකෙරේ.

නැවත වර්ගීකරණය
ජයා කන්ටේනර් ටර්මිනල්ස් සමාගම විසින් මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා වූ ව්‍යාපාර ආකෘතියේ අරමුණ වෙනස් කරන දුර්ලභ අවස්ථාවන්හි දී හැර, මූල්‍ය වත්කම් ඒවායේ මූලික හඳුනා ගැනීමෙන් පසුව නැවත වර්ගීකරණය නොකෙරේ.

හඳුනා නොගැනීම
ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම විසින් මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතිය කල් ඉකුත් වූ විට, හෝ මූල්‍ය වත්කමේ හිමිකාරත්වයේ අවදානම් සහ ප්‍රදාන සැලකියයුතු ලෙස මාරු කරන යම් ගනුදෙනුවක ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය මාරු කරන විට, හෝ ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම හිමිකාරිත්වයේ සියළුම අවදානම් සහ ප්‍රදාන සැලකිය යුතු ලෙස මාරු නොකරන හෝ රඳවා නොගන්නා සහ මූල්‍ය වත්කමේ පාලනය රඳවා නොගන්නා විට, මූල්‍ය වත්කමක් හඳුනා නොගනී. ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම ගනුදෙනුවට අවතීර්ණ වුවහොත් සහ ඒ තුළින් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනාගත් වත්කම් මාරු කරනු ලැබුවත්, මාරු කළ වත්කම්වල අවදානම් සහ ප්‍රදාන සියල්ලම හෝ සැලකිය යුතු ලෙස රඳවා ගන්නේ නම්, එවැනි මාරු කළ වත්කම් හඳුනා නොගනී.

මූල්‍ය වත්කම් – 2018 අප්‍රේල් 1 දිනට පෙර අදාළ ප්‍රතිපත්තිය
2018 අප්‍රේල් 1 දිනට පෙර, ජයා කන්ටේනර් ටර්මිනල්ස් සමාගම විසින් සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන එක් කාණ්ඩයකට වර්ගීකරණය කරන ලදී :
- ණය සහ ලැබීම්;
- කල්පිරෙන තෙක් රඳවා ගන්නා;
- විකිණීමට තබා ඇති; සහ
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමට, සහ මෙම වර්ගීකරණය තුළ:
  - අලෙවිය සඳහා තබා ඇති;
  - ව්‍යුත්පන්න ඉදිරි රැකුම් උපකරණ; හෝ
  - ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමට නම්කළ.

මූලික සහ පසුකාලීන අගය කිරීම

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්
සාධාරණ අගයකින් මනිනු ලබන අතර එහි පොලී හෝ ලාභාංශ ආදායම ඇතුළුව එහි වෙනස්වීම් ලාභය හෝ අලාභය තුළ හඳුනා ගන්නා ලදී.

කල්පිරෙන තෙක් රඳවා ගන්නා මූල්‍ය වත්කම්
ඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

ණය සහ ලැබීම්
ඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම්
සාධාරණ අගයකින් මනිනු ලබන අතර ණය උපකරණ මත හානිකරණ අලාභ, පොලී ආදායම සහ විදේශ ව්‍යවහාර මුදලේ වෙනස්වීම් හැර එහි වෙනස්වීම් ලාභය හෝ අලාභය තුළ හඳුනා ගන්නා ලද අතර සාධාරණ වටිනාකමේ සංචිතය තුළ සමුච්ඡිත කරන ලදී. මෙම වත්කම් හඳුනා නොගන්නා විට, ස්කන්ධය තුළ එකතු වූ ලාභය හෝ අලාභය ලාභය හෝ අලාභයට නැවත වර්ගීකරණය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

මූල්‍ය වත්කම් – 2018 අප්‍රේල් 1 දින සිට අදාළ ප්‍රතිපත්තිය
ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම මූලිකවම උපකරණයෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා පාර්ශ්වකරුවෙක් බවට පත්වන විට ණය සුරැකුම්පත් හැර වෙනත් මූල්‍ය වගකීම් හඳුනාගනී. ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත් ඒවා උත්පාදනය වන විට හඳුනා ගනී. සියළුම මූල්‍ය වගකීම් මූලිකවම සාධාරණ වටිනාකමට මනිනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මැනීමක් නොකළ අයිතමයක් එහි නිකුතුවට සෘජුවම ආරෝපණය කළ හැකි ශුද්ධ ගනුදෙනු පිරිවැයට මනිනු ලබයි. ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ මූල්‍ය වගකීම්, ණය සහ ලැබීම්, ආපසු ගෙවිය හැකි කුලී සහ අනෙකුත් තැන්පතු, බැංකු අයිරා, වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් සමන්විත වේ.

වර්ගීකරණය, පසුකාලීන අගය කිරීම සහ ලාභ සහ අලාභ
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට හෝ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනින ලද ලෙස වර්ගීකරණය කරනු ලබයි. මූල්‍ය වගකීමක් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනින ලද ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ එය අලෙවිය සඳහා රඳවාගෙන ඇති බවට වර්ගීකරණය කරන්නේනම්, එය ව්‍යුත්පන්නයක්නම් හෝ මූලික හඳුනා ගැනීම මත එය එසේ නම් කර ඇත්නම් පමණි. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමට මනිනු ලබන අතර යම් පොලී වියදමක් ද ඇතුළුව ශුද්ධ ලාභ හා පාඩු ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලබයි. අනෙකුත් මූල්‍ය වගකීම් ඵලදායි පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුකාලීනව මනිනු ලබයි. අනෙකුත් මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම මත පොලී වියදම, විදේශ විනිමය ලාභ හා පාඩු ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලබයි.

නැවත වර්ගීකරණය
SLFRS 9 මඟින් මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණයට අවසර නැති බැවින් මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකෙරේ.

හඳුනා නොගැනීම
ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම එහි ගිවිසුම්ගත බැඳීම් නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනා නොගනී. ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් එහි නියමයන් වෙනස් කළ විට සහ වෙනස් කළ වගකීම්වල මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ලෙස වෙනස් වන විට මූල්‍ය වගකීමක් හඳුනා නොගන්නා අතර, එම අවස්ථාවේ දී වෙනස් කරන ලද නියමයන් මත පදනම් වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයට හඳුනා ගනු ලබයි. මූල්‍ය වගකීමක් හඳුනා නොගැනීම මත, ශුන්‍ය වූ ධාරණ අගය සහ ගෙවූ ප්‍රතිෂ්ඨාව (මාරු කළ මුදල් නොවන වත්කම් හෝ භාරගත් වගකීම් ඇතුළුව) අතර වෙනස ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

2.3.5.2 මූල්‍ය වගකීම් - 2018 අප්‍රේල් 1ට පෙර අදාළ ප්‍රතිපත්තිය

හඳුනා ගැනීම
2018 අප්‍රේල් 1ට පෙර, ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගම විසින් සිය මූල්‍ය වගකීම් පහත දැක්වෙන එක් කාණ්ඩයකට වර්ගීකරණය කරන ලදී:
•ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමට සහ මෙම වර්ගීකරණය තුළ:
- අලෙවිය සඳහා තබා ඇති;
- ව්‍යුත්පන්න ඉදිරි රැකුම් උපකරණ; හෝ
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම ලෙස නම්කළ.
• වෙනත් මූල්‍ය වගකීම්

මූලික සහ පසුකාලීන අගය කිරීම:
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම මූල්‍ය වගකීම්
සාධාරණ වටිනාකමට මනිනු ලබන අතර එහි පොලී හෝ ලාභ හා අලාභ ඇතුළු වෙනස්කම් ද ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

වෙනත් මූල්‍ය වගකීම්
ඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි.

හිලව් කිරීම
ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමට මුදල හිලව් කිරීමට දැනට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් ඇති සහ ඒවා ශුද්ධ පදනමක් මත පියවා ගැනීමට හෝ එකවර වත්කම මුදාහැරීමට සහ වගකීම් නිරවුල් කිරීමට අදහසක් ඇති විට හෝ පමණක්, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරන අතර ශුද්ධ ප්‍රමාණය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

2.3.6 අවසන් තොග

සමාගමේ අවසන් තොගය යන්නෙන් එදිනෙදා භාවිතය සඳහා සමාගමේ ප්‍රධාන ගබඩා තුළ ගබඩා කර ඇති පාරිභෝගික භාණ්ඩ, විදුලි හා ද්‍රව්‍ය අයිතම, ලිපි ද්‍රව්‍ය, පොම්ප, එංජින් සහ බෝයිලේරු යනාදිය සඳහා මිලදීගත් උඳුන් සහ ඩීසල් තෙල් සහ වෙනත් අයිතම ආදිය නියෝජනය කරයි. තොගය මැනීමේදී යොදා ගන්නා ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ පෙර පිවිසි පෙර පිටවුම් (FIFO) ක්‍රමයයි. තොගය තක්සේරු කිරීම සඳහා භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිකළ හැකි වටිනාකමින් වඩාඅඩු අගයයි. කිරිපිටි, ලිපි ද්‍රව්‍ය, ද්‍රව්‍යාංග සහ විදුලි අයිතම ඉන්ධන වැනි බොහෝ භාණ්ඩවල ශුද්ධ උපලබ්ධිකළ හැකි වටිනාකම ගණනය කිරීම අසීරු බැවින්, තොග පිරිවැයට ගණන් බලා ඇත.

2.3.7 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් සහ මුදලට සමාන දෑ යන්න අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතා ආයෝජන, දැනුවත් මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දෑ ලෙස අර්ථ දක්වන අතර, වටිනාකමේ සුළු වෙනස් වීමේ අවදානමකට යටත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදලට සමාන දෑ අතැති මුදල් සහ හිඟ බැංකු අයිරාවලින් ශුද්ධ බැංකුවල තැන්පත් කිරීම්වලින් සමන්විත වේ. කෙටි කල් පිරීම් සහිත ආයෝජන එනම් අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජනද මුදලට සමාන දෑ ලෙස සැලකේ.

2.3.8 (i) දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා සඳහා වන පිරිවැය, අඩුකළ සමුච්චිත ක්ෂයකිරීම හා වටිනාකමේ සමුච්චිත හානිකිරීම් හැර පිරිවැයට සඳහන් කරනු ලබයි. පිරිවැය දරන අවස්ථාවේදී සහ හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලන අවස්ථාවේදී පිරියත සහ යන්ත්‍රෝපකරණ, ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්, කාර්යාල උපකරණ, පරිගණක සහ උපාංගවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් වේ.

වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සරල මාර්ගික පදනමක් මත ක්ෂය කිරීම ගණනය කෙරේ. වත්කමක ක්ෂයකිරීම එය භාවිතය සඳහා ලබාගත හැකි අවස්ථාවේදී ආරම්භ වන අතර, වත්කම විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කරන හෝ හඳුනා නොගන්නා දින වලට කලින් දින වල නතර කෙරේ.

දේපල, පිරියත සහ උපකරණවල යම් අයිතමයක් බැහැර කිරීම මත හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු නොවන අවස්ථාවක දී හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීම මත ඇතිවන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීමේ ආදායමේ සහ වත්කම් ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරන) වත්කම හඳුනා නොගන්නා වසර තුළ ආදායම් ප්‍රකාශනය තුළ ඇතුළත් කෙරේ.

වත්කම්වල සුන්බුන් වටිනාකම්, ප්‍රයෝජනවත් ආයු කාලයන් සහ ක්ෂයකිරීමේ ක්‍රම සමාලෝචනය කරන අතර, සුදුසු නම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී ගලපනු ලැබේ. භාවිතා කරන ප්‍රතිශත පහත පරිදි වේ; වත්කම් සත්‍යාපන කමිටුව විසින් සිදුකළ නිර්දේශවලට අනුව, සමහර වත්කම්වල ඵලදායී ජීවකාලය වෙනස් වී ඇති අතර ඒ අනුව ගලපා ඇත.

පිරියත සහ යන්ත්‍රෝපකරණ	12.5%
කාර්යාල උපකරණ	12.5%
පරිගණක උපකරණ	25%
මෝටර් වාහන	20%
ගෘහභාණ්ඩ	20%

(ii) මෙට්‍රික් ටොන් 3200 ධාරිතාවයේ ගබඩා ටැංකිය සහ ගිනි පෙන පද්ධතිය ඉදිකිරීම සඳහා දරන ලද වියදම්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ජේටීසී ලිමිටඩ් සමාගම අතර කළමනාකරණ සේවා ගිවිසුම අනුව, සියලුම ප්‍රාග්ධන වියදම ජේටීසී ලිමිටඩ් විසින් දැරිය යුතුය. (ශ්‍රී ලංකා වරාය අධිකාරිය වත්කම් ගොඩ නැගීමට අයිතිය ලබාදී ඇත) ඉඩම සහ දේපල ජේටීසී ලිමිටඩ් වෙත අයත් නොවන බැවින්, මෙට්‍රික් ටොන් 3200 ධාරිතාවයේ ගබඩා ටැංකිය සහ ගිනි පෙන පද්ධතිය ඉදිකිරීම සඳහා දරන ලද වියදම් ජංගම නොවන වත්කම්වල විලම්භිත වියදමක් ලෙස හඳුනා ගෙන ඇති අතර අස්පෘශ්‍ය වත්කම්වලට සමානව ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් අතර වාර්තා කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමැතිය මෙම ගනුදෙනුව වාර්තා කිරීම සඳහා ලැබී ඇත. 2023 සිට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තීරණය

කළ පරිදි වත්කම්වල ඵලදායි ජීව කාලය පුරා මෙය ක්‍රමක්ෂය කරනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය දන්වා ඇති පරිදි, මෙට්‍රික් ටොන් 3200 ධාරිතාවයේ ගබඩා ටැංකියේ ඵලදායි ජීව කාලය අවුරුදු 60ක වන අතර ගිනි පෙන පද්ධතිය සඳහා එය අවුරුදු 15කි.

(iii) අස්පෘශ්‍ය වත්කම්

මෙය දේශීය ටැංකි ට්‍රක් රථ බෙදාහැරීම් හා වෙනත් මෙහෙයුම් කටයුතු සඳහා මෙහෙයුම් අංශය විසින් හඳුන්වා දෙන ලද පරිගණක පද්ධතියකි. ඵලදායි ජීව කාලය මත පදනම් වී හා තොරතුරු තාක්ෂණයේ අනාගත ප්‍රවනතා සලකා බලමින්, ඵලදායි ජීව කාලය වසර පහක් සහ වසර පහත කාලසීමාව පුරා මෘදුකාංගය ක්‍රමක්ෂය කරන බවට සමාගම තීරණය කරයි.

2.3.9 කල්බදු වත්කම්

සමාගම සඳහා මෝටර් වාහන හතරක් මිලදී ගැනීම සඳහා සමාගම විසින් මූල්‍ය කල්බදු පහසුකම් හතරක් ලබා ගෙන ඇත. කල්බදු ආරම්භයේ දී කල්බදු දේපළේ සාධාරණ වටිනාකමට හෝ අඩු නම් අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට මූල්‍ය කල්බදු ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. වගකීමේ ඉතිරි ශේෂය මත ස්ථාවර පොලී අනුපාතයක් ලබා ගැනීම සඳහා කල්බදු ගෙවීම් මූල්‍ය ගාස්තු හා කල්බදු වගකීම අඩු කිරීම අතර බෙදනු ලබයි. වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය තුළ කල්බදු වත්කමක් ක්ෂය කිරීම සිදු කරයි.

2.3.10 වෙන් කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සමාගමට වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) ඇති විට, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලා ඒම අවශ්‍ය විය හැකි සහ බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වාසදායක තක්සේරුවක් කළ හැකි අවස්ථාවේදී වෙන්කිරීම් හඳුනා ගනී. සමාගම වෙන්කිරීමක කොටසක් හෝ සියල්ලම ප්‍රතිපූරණය කිරීමට අපේක්ෂා කරන විට, ප්‍රතිපූරණය සැබැවින්ම නිශ්චිත වූ විට පමණක් ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගනී. යම් වෙන්කිරීමකට අදාළ වියදම යම් ප්‍රතිපූරණවලින් ශුද්ධව ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කෙරේ. මුදල්වල කාලීන වටිනාකමේ බලපෑම වැදගත්වේ නම්, මුදලේ කාලීන වටිනාකම පිළිබඳ සහ සුදුසු අවස්ථාවන්හිදී වගකීම්වලට අදාළ අවදානම් පිළිබඳ වර්තමාන වෙළෙඳපොළ තක්සේරු පිළිබිඹු කරන පූර්ව බදු අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම මඟින් වෙන් කිරීම් තීරණය කරනු ලැබේ. වට්ටම්කිරීම භාවිතා කරන අවස්ථාවේදී, කාලය ගෙවීම හේතුවෙන් වෙන්කිරීම තුළ වැඩිවීම පොලී වියදමක් ලෙස හඳුනා ගනී.

2.3.11 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

සමාගම විසින් වාර්ෂිකව පාරිතෝෂිකය සඳහා පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මනිනු ලබන අතර, එය ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය වට්ටම් අනුපාත සහ අනාගත වැටුප් වැඩිවීම් පිළිබඳව උපකල්පන සිදු කිරීම හා සම්බන්ධ වේ. තක්සේරුවේ සංකීර්ණත්වය, පාදක වූ උපකල්පන සහ එහි දිගු කාලීන ස්වභාවය, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක් මෙම උපකල්පනවල වෙනස්වීම්වලට ඉතා සංවේදී වේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම යටතේ අයිතමය දක්වා ඇත.

වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත

ආ) නිශ්චිත දායක සැලසුම් – අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ පනත් හා රෙගුලාසි වලට අනුකූලව සේවකයින් අර්ථසාධක අරමුදල් දායකත්වයන් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයන් සඳහා සුදුසුකම් ලබයි. සමාගම පිළිවෙලින් සේවකයින්ගේ දළ වැටුපෙන් 15 % ක් සහ 3 % ක් අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වේ.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

		2024	2023
3.	**ආදායම**	රු	රු
	තෙල්බැංකු සේවා ගාස්තු ආදායම	719,870,640	612,328,282
	ශුද්ධ ආදායම	**719,870,640**	**612,328,282**

		2024	2023
3.1	**මෙහෙයුම නොවන ආදායම**	රු	රු
	ඉවතලන ලද භාණ්ඩ බැහැර කිරීම සහ ටෙන්ඩර් වලින් ආපසු නොගෙවන තැන්පතු	156,712	1,558,899
		156,712	**1,558,899**

3.2 සැසැඳීම

නිෂ්පාදනය	පැටවීම (මෙ.ටො.)		මුදාහැරීම (මෙ.ටො.)	
	2024	**2023**	**2024**	**2023**
LSFO 380 පිරිවැය	487,642.83	337,126.45	492,791.99	344,736.17
MGO	75,243.34	75,243.34	75,913.23	75,449.81
එකතුව	**564,910.17**	**412,369.79**	**570,729.22**	**420,185.98**

4. මූල්‍ය ආදායම/පිරිවැය

		2024	2023
4.1	**මූල්‍ය ආදායම**	රු	රු
	ඉතුරුම් ගිණුම් මත පොළී ආදායම	4,025,144	4,145,898
	ස්ථාවර තැන්පතු මත පොළී ආදායම	70,821,301	112,736,287
	සේවක ණය මත පොළී ආදායම	6,008,918	5,364,325
		80,855,363	122,246,510

		2024	2023
4.2	**මූල්‍ය පිරිවැය**	රු	රු
	ණය හා ණයගැනීම් මත පොළී වියදම	5,952,242	11,187,747
	සේවකයින් සඳහා නිවාස ණය මත පොළී වියදම	517,641	589,707
	මූල්‍ය කල්බදු සඳහා පොළී වියදම	137,929	757,018
		6,607,812	12,534,472

5. දේපල, පිරියත හා උපකරණ

5.1 දළ ධාරණ වටිනාකම	2024.01.01 දිනට ශේෂය රු	වසර තුළ එකතු කිරීම රු	බැහැරකිරීම / ඉවත්කිරීම රු	2024.12.31 දිනට ශේෂය රු
පිරියත හා යන්ත්‍ර	88,095,655	34,787,415	-	122,883,070
ලිබඩු හා සවිකිරීම්	21,670,572	1,811,469	-	23,482,041
කාර්යාල උපකරණ	9,365,653	797,150	-	10,162,803
පරිගණක උපකරණ	8,710,447	497,798	-	9,208,245
මෝටර් රථ	62,163,429	-	-	62,163,429
ක්ෂයකළහැකි වත්කම්වල මුළු පිරිවැය	**190,005,756**	**37,893,832**	-	**227,899,588**

5.2 ක්ෂයකිරීම	2024.01.01 දිනට ශේෂය රු	වසර තුළ එකතු කිරීම රු	බැහැරකිරීම / ඉවත්කිරීම රු	2024.12.31 දිනට ශේෂය රු
පිරියත හා යන්ත්‍ර	36,188,703	8,157,324	-	44,346,027
ලිබඩු හා සවිකිරීම්	8,869,192	3,284,569	-	12,153,761
කාර්යාල උපකරණ	5,258,886	1,081,206	-	6,340,092
පරිගණක උපකරණ	6,149,555	981,907	-	7,131,462
මෝටර් රථ	31,338,512	4,205,595	-	35,544,107
මුළු ක්ෂයකිරීම	**87,804,848**	**17,710,601**	-	**105,515,449**

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

පිරියත හා යන්ත්‍ර	78,537,043	51,906,952
ලිබඩු හා සවිකිරීම්	11,328,280	12,801,380
කාර්යාල උපකරණ	3,822,711	4,106,767
පරිගණක උපකරණ	2,076,783	2,560,892
මෝටර් රථ (කල්බදු වත්කම් ඇතුළුව)	26,619,322	30,824,917
දේපල, පිරියත හා උපකරණවල මුළු ධාරණ අගය	**122,384,139**	**102,200,908**

භාවිතයට අයිතිය ඇති වත්කම් - මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් මෝටර් රථ

2019 අගෝස්තු මාසයේදී මූල්‍ය කල්බදු පහසුකම හරහා මිලදී ගත් රු.43,004,500.00 වටිනා මෝටර් රථ හතර 2024.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම රු.20,783,461.00 කි.

5.4 වත්කම්වල ඵලදායී ජීව කාලය පහත පරිදි තක්සේරු කෙරේ.

	2024	**2023**
පිරියත හා යන්ත්‍ර	වසර 8	වසර 8
ලිබඩු හා සවිකිරීම්	වසර 5	වසර 5
කාර්යාල උපකරණ	වසර 8	වසර 8
පරිගණක උපකරණ	වසර 4	වසර 4
*මෝටර් රථ	වසර 5	වසර 5

*මෝටර් වාහන ක්ෂය කිරීමේදී පහත සඳහන් වාහන හැර අනෙකුත් සියලුම වාහන සඳහා වසර 5 ක කාලය යොදා ගෙන ඇත.

වත්කම් සත්‍යාපන /සමාලෝචන කමිටුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිකාලය තක්සේරු කර ඇති අතර පහත පරිදි සමහර වත්කම්වල ඵලදායී ජීව කාලය දීර්ඝ කර ඇත.

	ආර්ථික ඵලදායී ජීව කාලය	අනාගත ඵලදායී ජීව කාලය
එන්ජින්පොම්පය	15	9
මිට්සුබිෂි කාරය	13	3
KDH වෑන්	15	7
ඩබල් කැබ්	15	9
මෝටර් සයිකලය	10	5
RUSH කාර් 3	10	5
සීසීටීවී කැමරා පද්ධතිය	10	3
ජෙනරේටරය 44 KVA	15	12
බෙන්ස් C 200	15	10
මෝටරය සහිත එන්ජින් පොම්පය-RSP/HW	10	6
හයිබ්‍රිඩ් කන්ටේනර් පෙට්ටිය -SJ	10	6
ලී ගොනු රාක්ක -ලේඛණාගාරය	13	6
තෙල් ගබඩා ටැංකිය (SJ)	15	6
රේඩාර් ටැංකි මිනුම් පද්ධතිය	8	3
බහලුම් කාර්යාල කැබින් - බන්ධිත	10	6
එන්ජින් පොම්පය සඳහා ප්‍රධාන අමතර කොටස් (Rush)	7	4

ශුද්ධ පොත් අගයන් ශූන්‍ය වන ස්ථාවර වත්කම් ලැයිස්තුව පහත සාරාංශ කෙරේ.

5.5

වත්කම් වර්ගය	පිරිවැය (රු.)	අයිතම ගණන
පිරියත හා යන්ත්‍ර	11,773,603	32
ලිබඩු හා සවිකිරීම්	5,736,227	79
කාර්යාල උපකරණ	3,016,298	70
පරිගණක උපකරණ	5,253,055	67

ඉහත වත්කම් අනාගතයේදී ප්‍රත්‍යාගණනයක් සිදු කිරීමෙන් පසු ජංගම නොවන වත්කම්වලට ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

5.6 අස්පෘශ්‍යා වත්කම්

	2024	2023
මෙහෙයුම් අංශය සඳහා මිලදී ගත් මෘදුකාංගය	රු	රු
ක්‍රමක්ෂය	1,040,583	817,700
	(185,957)	(102,117)
	854,626	**715,583**

5.7 වැංකිය ඉදිකිරීම හා ගිනි පෙන පද්ධතිය සඳහා විලම්භිත වියදම්

	2024.01.01 දිනට ශේෂය	ක්‍රමක්ෂය	2024.12.31 දිනට ශේෂය
මෙ.ටො.3200 ගබඩා වැංකිය හා ගිනි පෙන	99,030,542	(1,704,973)	97,325,569
පද්ධතියසඳහා විලම්භිත වියදම්	48,117,550	(3,701,350)	44,416,200
	147,148,092	(5,406,323)	**141,741,769**

6. වෙළෙඳ හා අනෙකුත් ලැබීම්

		2024	2023
		රු	රු
6.1 *වෙළෙඳ ලැබීම් - සම්බන්ධිත පාර්ශ්ව		67,721,408	69,379,694
		67,721,408	69,379,694
6.2 අත්තිකාරම් හා පෙර ගෙවීම්		26,445,897	38,234,708
සේවක ණය	එක් වසරක් තුල ලැබිය යුතු	19,333,159	15,916,577
		113,500,464	123,530,979
සේවක ණය	එක් වසරට වැඩි කාලයතුල ලැබිය යුතු	38,057,453	35,798,566

6.1 සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් වෙළෙඳ ලැබීම්

	සම්බන්ධතාව	2024	2023
		රු	රු
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (කළමනාකරණ ගාස්තු)	මව් සමාගම	67,721,408	69,379,694
		67,721,408	69,379,694

6.2 අත්තිකාරම් හා පෙර ගෙවීම්

	2024	2023
	රු	රු
වෙනත් ණයකරුවන්ගෙන් ලැබීම්	12,390	8,050
අත්තිකාරම් ගෙවීම්	752,000	3,077,000
තැන්පතු	215,160	152,434
ලැබියයුතු පොළිය	25,344,668	34,997,224
වෙනත් ලැබියයුතු දෑ	121,679	-
	26,445,897	38,234,708

7. මූල්‍ය වත්කම්

	2024	2023
	රු	රු
කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන		
කල්පිරෙන තුරු තබාගන්නා ස්ථාවර තැන්පතු	597,959,213	564,338,191
	597,959,213	564,338,191

8. මුදල් හා මුදලට සමාන දෑ

	2024	2023
	රු	රු
ජංගම/ඉතුරුම් ගිණුම	69,480,692	37,322,900
අතැති මුදල්	17,395	10,965
ස්ථාවර තැන්පතු	151,541,158	140,714,385
මුළු මුදල් හා මුදලට සමාන දෑ	221,039,245	178,048,250

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

9. ප්‍රකාශශත ප්‍රාග්ධනය

	2024		2023	
	සංඛ්‍යාව	රු	සංඛ්‍යාව	රු
සාමාන්‍ය කොටස්	100,000	1,000,000	100,000	1,000,000
	100,000	1,000,000	100,000	1,000,000

10. පොළිය දරන ණය සහ ණය ගැනීම්

වැංකිය ඉදිකිරීම සහ ගිනි පෙන පද්ධතිය සඳහා ස්ථාවර තැන්පතුවෙන් ලබාගත් ණය

	2024.12.31 දිනට රු	2023.12.31 දිනට රු
ජංගම නොවන වගකීම්		
ස්ථාවර තැන්පතුවෙන් ලබාගත් ණය	-	73,897,010
(එක් වසරකින් පසු ආපසු ගෙවියයුතු ප්‍රමාණය)	-	
	-	73,897,010
ජංගම වගකීම්		
ස්ථාවර තැන්පතුවෙන් ලබාගත් ණය	-	11,301,600
(එක් වසරක් තුලආපසු ගෙවියයුතු ප්‍රමාණය)	-	11,301,600

10 පොළිය දරන ණය සහ ණය ගැනීම් (ඉතිරි කොටස)

රුපියල් මිලියන 45.3 සඳහා අංක: 79251603, රුපියල් මිලියන 44.1 සඳහා අංක 80427028 සහ රුපියල් මිලියන 36.8 සඳහා අංක 83586139 දරන රුපියල් ස්ථාවර තැන්පතු සඳහා කැපබලය ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ පවත්වා ගනී . මුළු ණය වටිනාකම රුපියල් මිලියන 113 ක් වන අතර,ජේසීටී ලිමිටඩ් හි මෙට්‍රික් ටොන් 3200 ක ගබඩා වැංකිය ඉදිකිරීම සහ ගිනි පෙන පද්ධතිය ස්ථාපනයේ ඉතිරි ශේෂය ගෙවීම සඳහා ලබාගෙන ඇත . පොලී අනුපාතය ස්ථාවර තැන්පතු අනුපාතය + 1% වන අතර ආපසු ගෙවීමේ කාලය වසර 10 කි. මෙම ණය සම්පූර්ණයෙන්ම 2024.09.18 දින ගෙවන ලදි.

11. මූල්‍ය කල්බදු පහසුකම්

	2024.12.31 දිනට රු	2023.12.31 දිනට රු	ගෙවීම් කාලය රු	පොළී අනුපාතය
ජංගම නොවන වගකීම්				
මූල්‍ය කල්බදු වගකීම	-	-		
(එක් වසරකින් පසු ආපසු ගෙවියයුතු ප්‍රමාණය)	-	-	මාස 60 වාරික	පොළී අනුපාතය 13.00%
ජංගම වගකීම්			ලංකා බැංකුව	
මූල්‍ය කල්බදු වගකීම	-	3,229,777		
(එක් වසරක් තුලආපසු ගෙවියයුතු ප්‍රමාණය)	-	**3,229,777**		

*මූල්‍ය කල්බදු වගකීම, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සමඟ සමාගම වෙනුවෙන් මෝටර් කාර් හතරක් මිලදී ගැනීමට ලබාගන්නා ලදී

12. සේවක ප්‍රතිලාභ වගකීම

	2024 රු	2023 රු
12.1 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම		
නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය තුළ වෙනස්වීම් පහත පරිදි වේ:		
ජනවාරි 1 දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම	20,015,878	19,212,172
වසර සඳහා වෙනස (සටහන 12.2)	4,885,610	4,375,582
බැඳීම මත ආයුගණක ලාභ/(අලාභය)	6,687,680	(1,529,645)
ගෙවූ ප්‍රතිලාභ	(490,075)	(2,042,231)
දෙසැම්බර් 31 දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම	31,099,093	20,015,878

12.2 ශුද්ධ ප්‍රතිලාභ වියදම්

	2024 රු	2023 රු
ජංගම සේවා පිරිවැය	2,483,705	1,685,878
ප්‍රතිලාභ බැඳීම මත පොළී පිරිවැය	2,401,905	2,689,704
ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගන්නා ලද වියදම්	4,885,610	4,375,582

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

12.3 ආයුගණක හා කළමනාකරණ උපදේශක (පුද්ගලික) සමාගමේ ආයුගණකඥයින් විසින් 2024 දෙසැම්බර් 31 දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික පිළිබඳ ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදි. විශ්‍රාම ගැනීමේ ප්‍රතිලාභවල පිරිවැය තීරණය කිරීමේදී සුදුසු සහ තුලනාත්මක උපකල්පන භාවිතා කරන ලදී. 2024.12.31 දිනට භාවිතාකළ මූලික උපකල්පන පහත පරිදි වේ:

	2024	2023
ජනවිකාශ - උපකල්පන		
සේවක පිරිවැටුම් අනුපාතය	3.00%	5.00%
විශ්‍රාම ගැනීමේ වයස	60	60
මූල්‍ය උපකල්පන		
වට්ටම් අනුපාතය	11.00%	12.00%
වැටුප් වැඩිවීමේ අනුපාතය	8%	8%
ආයුගණක තක්සේරු ක්‍රමය	ප්‍රක්ෂේපිත ඒකක ණය	ප්‍රක්ෂේපිත ඒකක ණය

12. **නිශ්චිත ප්‍රතිලාභ බැදීම (ඉතිරි කොටස)**

12.4 **ආයුගණක තක්සේරුව තුළ භාවිතා කළ උපකල්පනවල සංවේදීතාව**

2024 වසර සම්බන්ධයෙන් සේවක ප්‍රතිලාභ වගකීම මැනීමේදී ස්ථිරව පැවති අනෙකුත් සියලුම විචල්‍යතා සමඟ සේවයේ යෙද වූ ප්‍රධාන උපකල්පනවල යුක්තිසහගතව වියහැකි වෙනසකට සංවේදීතාව පහත වගුවෙන් පෙන්නුම් කරයි.

ලාභාලාභ ප්‍රකාශය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංවේදීතාව යනු වසර සඳහා ලාභය හෝ අලාභය සහ සේවක ප්‍රතිලාභ බැඳීම මත වට්ටම් අනුපාතය සහ වැටුප් වර්ධක අනුපාතය තුළ පිළිගත් වෙනස්වීම්වල බලපෑමයි.

මූල්‍ය උපකල්පනවල පිළිගත් වෙනස	**නිශ්චිත ප්‍රතිලාභ බැදීම** රු
වට්ටම් අනුපාතය 1%කින් වැඩිවූයේනම්	28,957,895
වට්ටම් අනුපාතය 1%කින් අඩුවූයේනම්	33,509,625
වැටුප් වැඩිකිරීමේ අනුපාතය 1%කින් වැඩිවූයේනම්	33,414,449
වැටුප් වැඩිකිරීමේ අනුපාතය 1%කින් අඩුවූයේනම්	29,021,032

13. **අනෙකුත් ගෙවීම්**

	2024 රු	2023 රු
අනෙකුත් ගෙවීම් - වෙනත් (සටහන 13.1)	10,440,907	9,007,267
උපචිත වියදම්	20,511,061	19,545,938
නව BLH හි මුදල් තැන්පතු	46,396,822	60,910,077
	77,348,790	89,463,282

13.1 **අනෙකුත් - වෙනත්**

	2024 රු	2023 රු
ගෙවියයුතු එකතු කළ අගය මත බදු	9,550,413	8,231,156
වෙනත් ගෙවීම් -(පාරිතෝෂිකය/ ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු ඉන්ධන හා දුරකථන බිල්)	890,494	776,111
	10,440,907	9,007,267

14. **ආදායම් බදු**
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ආදායම් බදුවල ප්‍රධාන සංරචකයන් පහත දැක්වේ :

ආදායම් ප්‍රකාශය	2024 රු	2023 රු
වර්තන ආදායම් බදු අයකිරීම	107,408,434	109,349,495
විලම්භිත බදු	(2,866,377)	(1,030,659)
පෙර වසර සම්බන්ධයෙන් බදු අඩුවෙන්/(වැඩිපුර) වෙන් කිරීම	-	-
ආදායම් ප්‍රකාශය තුළ වාර්තාකළ ආදායම් බදු වියදම	104,542,057	108,318,836
ආරම්භයේදී ආදායම් බදු වගකීම	60,490,856	66,893,229
වර්තන ආදායම් බදු අයකිරීම	107,408,434	109,349,495
බදු බැර	(132,387,968)	(115,751,839)
අවසානයේදී ආදායම් බදු වගකීම	**35,511,322**	**60,490,856**

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

15. විලම්භිත බදු

දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගයේ තාවකාලික බදුකළහැකි වෙනස්වීම් හේතුවෙන් විලම්භිත බදු වගකීම

	ගිණුම්කරණ පදනම	බදු පදනම	2024 තාවකාලික කාල වෙනස රු.	2023 තාවකාලික කාල වෙනස රු.
	රු	රු		
දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගයන්	95,764,817	55,974,909	39,789,908	38,261,280
පාරිතෝෂික වෙන් කිරීම			(31,099,093)	(20,015,878)
			8,690,815	18,245,402
වසරතුළ ගලපන ලද ප්‍රමාණ			(2,866,377)	(1,030,659)
ආරම්භක විලම්භිත බදු ශේෂය			5,473,621	6,504,280
විලම්භිත බදු වගකීම			**2,607,247**	**5,473,621**

16. කොටසක ඉපයීම

16.1 වසර තුළ පවත්නා සාමාන්‍ය කොටස්වල බරතබනලද සාමාන්‍ය සංඛ්‍යාව මගින් සාමාන්‍ය කොටස්හිමියන්ට ආරෝපනය වන වසර සඳහා ලාභය බෙදීම මගින් කොටසක ඉපයීම් ගණනය කරනු ලැබේ. වසර තුළ සහ පෙර වසර තුළ පවත්නා සාමාන්‍ය කොටස්වල බරතබනලද සාමාන්‍ය සංඛ්‍යාව ප්‍රසාද දීමනා එකතුවක් ලෙස සම්පත්වල අනුරූප වෙනසක් නොමැතිව පවත්නා සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වෙනස් කරන සිදුවීමක් (ඇත්නම්) සඳහා ගලපනු ලැබේ.

16.2 කොටසක ඉපයීම ගණනය කිරීමේදී භාවිතා කළ ආදායම සහ හුවමාරු දත්ත පහත පෙන්නුම් කෙරේ.

	2024	2023
	රු	රු
ලවය ලෙස භාවිතා කළ ප්‍රමාණය		
වසර සඳහා ලාභය	243,415,111	243,875,173
කොටසක ඉපයීම සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපිත ලාභය	243,415,111	243,875,173
හරය ලෙස භාවිතා කළ සාමාන්‍ය කොටසක් සංඛ්‍යාව		
නිකුතුව තුළ සාමාන්‍ය කොටස්වල බරතබනලද සාමාන්‍ය සංඛ්‍යාව	100,000	100,000
කොටසක ඉපයීම	2,434.15	2438.75

17. බැඳීම් සහ අසම්භාව්‍යයන්

17.1 ප්‍රාග්ධන වියදම් බැඳීම්

සමාගමට වාර්තාකරන දිනය දක්වා සැලකියයුතු ප්‍රාග්ධන බැඳීම් නොමැත.

17.2. අසම්භාව්‍ය බැරකම්
නෛතික හිමිකම්;

01 ශ්‍රේෂ්ඨාධිකරණය (විශේෂ) LA 24/2023 - විශ්‍රාමගැනීමේ වයස
ශ්‍රී ලංකා මුහුදු ගාස්තු පිළිබඳ ජාතික සංගමය සහ තිදෙනෙකුට එදිරිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා වෙනත් 4 ක්
නීති උපදේශක: ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මයා

ශ්‍රී ලංකා ජාතික නැව්කරුවන්ගේ සංගමය (NUSS) සහ තවත් තිදෙනෙකු විසින් 2013/01/15 දිනැති පොදු ව්‍යවසාය චක්‍රලේඛ PED/චක්‍රලේඛය/01/2013 හි අදාළත්වය ඉල්ලා ජය බහාලුම් පර්යන්ත සමාගමට අංක 124/2013 අභියාචනාධිකරණ රිට් අයදුම්පත ගොනු කරන ලද අතර JCT සමාගම විසින් කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ 2013 දී ගොනුකළ සේවය අවසන් කිරීමේ අයදුම්පත සමාගම විසින් ඉල්ලා සිටියේය. අයදුම්පත ගාස්තුවකින් තොරව ප්‍රතික්ෂේප කරමින් JCT සමාගමට පක්ෂව 2022.12.12 දින නියෝගය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, අභියාචනාධිකරණ නියෝගයට එරෙහිව NUSS විසින් අභියාචනයක් (ශ්‍රේෂ්ඨාධිකරණ (විශේෂ) LA 24/2023 ගොනු කර ඇත. සමාගමේ නීතිඥවරයා JCT සමාගමට විසඳුමක් සලකා බැලීමට උපදෙස් දුන් බව 2024.11.25 දින අධිකරණයට දැනුම් දුන් බැවින්, පාර්ශවයන් සමථයකට පත් වී ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා 2025.03.20 දින මෙම කාරණය සඳහන් කරන ලදී.

02. කම්කරු විනිශ්චය සභා නඩු අංක. LT/2/addi/3676 - සමාගම එදිරිව කේ. ලියනගේ මහතා වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය
03. කම්කරු විනිශ්චය සභා නඩු අංක. LT/2/addi/3677 -සමාගම එදිරිව ඩබ්ලිව්. කොතලාවල මහතා වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය.
04. කම්කරු විනිශ්චය සභා නඩු අංක. LT/2/addi/3718/2016 - සමාගම එදිරිව එම්.ජේ බර්නාඩ් මහතා වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය.

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

02. කම්කරු විනිශ්චය සභා නඩු අංක. LT/2/addi/3676 - සමාගම එදිරිව කේ. ලියනගේ මහතා වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය
03. කම්කරු විනිශ්චය සභා නඩු අංක. LT/2/addi/3677 -සමාගම එදිරිව ඩබ්ලිව්. කොතලාවල මහතා වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය.
04. කම්කරු විනිශ්චය සභා නඩු අංක. LT/2/addi/3718/2016 - සමාගම එදිරිව එම්.ජේ බර්නාඩ් මහතා වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය.

මෙම නඩු ගොනු කරනු ලැබුවේ PED/Circular/01/2013 හා 2013.05.15 දිනැති චක්‍රලේඛය පරිදි විශ්‍රාම යාමේ වයස 60 දක්වා ඉල්ලා සිටිමින් අවුරුදු 57 දී විශ්‍රාම ගිය විශ්‍රාමික සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය විසින්ය. විශේෂ අභියාචනා අවසරය පිළිබඳ තීන්දුව ලැබෙන තෙක් නඩු කල් දමන ලදී. (SC (Spl) 24/2023)
මෙම නඩු ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ලැබෙන තෙක් කල් දමා ඇත.(SC (Special) LA 24/2013)

06. කම්කරු දෙපාර්තමේන්තුවේ විමසුම – CN/COM/INS/ 201909/05

2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි JCT සමාගමේ සේවකයින්ට රු. 7800 ක ජීවන වියදම් දීමනාවක් ගෙවා ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, ජාතික සේවක සංගමය සහ අන්තර් සමාගම් සේවක සංගමය 2014 සිට (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ දිනයට අනුව) ජීවන වියදම් දීමනාව ඉල්ලා සිටිමින් කම්කරු කොමසාරිස්වරයා වෙත පැමිණිල්ලක් ගොනු කළේය.

2021.04.28 දිනැති නියෝගය මගින් කොමසාරිස් විසින් 2021.05.17 දින හෝ ඊට පෙර රු. 19,164,600/- ක ගෙවීමක්සිදු කරන ලෙස නියෝග කළේය. පසුව JCT සමාගම විසින් නියෝගය සමාලෝචනය කරන ලෙස ඉල්ලා කම්කරු කොමසාරිස් ජනරාල් වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. මෙම පැමිණිල්ල කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස් - බටහිර කලාපය III ඉදිරියේ විභාග වෙමින් පවතී.

අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය සම්බන්ධයෙන්, අභියාචනය ඉදිරියට ගෙන යාමට සහ මෙම කාරණය බේරුම්කරණය සඳහා යොමු කිරීමට 2024.07.24 දිනැති ඉල්ලීම් ලිපියක් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලදී.

18. ඔඩපනයකළ වත්කම්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා සමාගම විසින් ලංකා බැංකුවෙන් ලබාගත් කාලීන ණය සඳහා පහත වත්කම් ඔඩපනය කර ඇත.

1.රුපියල් මිලියන 45.3 සඳහා අංක: 79251603, රුපියල් මිලියන 44.1 සඳහා අංක 80427028 සහ රුපියල් මිලියන 36.8 සඳහා අංක 83586139 දරන රුපියල් ස්ථාවර තැන්පතු සඳහා කැපබලය ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ පවත්වා ගනී. මුළු ණය වටිනාකම රුපියල් මිලියන 113 ක් වන අතර, ජේසීටී ලිමිටඩ් හි මෙට්රික් ටොන් 3200 ක ගබඩා ටැංකිය ඉදිකිරීම සහ ගිනි පෙන පද්ධතිය ස්ථාපනයේ ඉතිරි ශේෂය ගෙවීම සඳහා ලබාගෙන ඇත. පොලී අනුපාතය ස්ථාවර තැන්පතු අනුපාතය + 1% වන අතර ආපසු ගෙවීමේ කාලය වසර 10 කි. .

අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි මෙම නය 2024.09.18 දින ගෙවන ලදි

19. සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ

සැලකිය යුතු සම්බන්ධිත පාර්ශ්ව අනාවරණයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ:

19.1 මව් සමාගම හා අදාළ ආයතන සමඟ ගනුදෙනු

	2024	2023
<u>වෙළෙඳ ලැබීම්</u>	රු	රු
කළමනාකරණ ගාස්තු ආදායම	67,721,408	69,379,694
<u>ගෙවියයුතු</u>		
ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු -දුරකථන/බිල්පත්	506,095	399,535
ඉන්ධන සඳහා තැන්පතු	103,600	103,600

20. සමාගමේ හෝ එහි මව් සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු

ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs) යනු සමාගමේ මෙන්ම පරිපාලිත සමාගම්වල කටයුතු ඍජු හෝ වක්‍රව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ විධායකයින් වැනි පුද්ගලයින් ලෙස අර්ථ දැක්වේ.

21. ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs) වන්දි ගෙවීම

	2024	2023
	රු	රු
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ (අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු)	1,172,968	1,887,108
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ සඳහා දීමනාව	2,576,700	2,717,519
	3,749,668	**4,604,627**

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

22. වාර්තා කරන දිනට පසුව සිදුවන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයේ ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන වාර්තාකරණ දිනයට පසුව සැලකිය යුතු ගනුදෙනු හෝ සිදුවීම් නොමැත.

23. අවදානම් කළමනාකරණ අනාවරණය

මූල්‍ය උපකරණවලින් සමාගමට පහත අවදානම් වලට නිරාවරණය වී ඇත:

a) ණය අවදානම
b) ද්‍රවශීලතා අවදානම
c) වෙළෙඳපොල අවදානම

ඉහත සඳහන් එක් එක් අවදානම් වලට සමාගම නිරාවරණය වීම, සමාගමේ අරමුණු, අවදානම් මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් සහ සමාගමේ ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම පිළිබඳ තොරතුරු මෙම සටහන මඟින් ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන තුළ තවදුරටත් ප්‍රමාණාත්මක අනාවරණය කිරීම් ඇතුළත් වේ.

23.1 අවදානම් කළමනාකරණ රාමුව

සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත. සමාගම මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම සඳහා සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත.

වෙළෙඳපොල තත්වයන්හි වෙනස්වීම් සහ සමාගමේ ක්‍රියාකාරකම් පිළිබිඹු කිරීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.
ප්‍රමිති හා ක්‍රියා පටිපාටි පුහුණු කිරීම සහ කළමනාකරණය කිරීම තුළින් සමාගම විනයගරුක හා ඵලදායී පාලන පරිසරයක් ඇති කිරීම අරමුණු කරන අතර එමඟින් සියළුම සේවකයින්ට ඔවුන්ගේ කාර්යභාරයන් සහ යුතුකම් අවබෝධ කරගනී.

23.2 අවදානම් කළමනාකරණ අනාවරණය (ඉදිරියට...)

අ) ණය අවදානම

ණය අවදානම යනු මූල්‍යමය උපකරණයක් හෝ පාරිභෝගික කොන්ත්‍රාත්තුවක් යටතේ මූල්‍ය අලාභයක් ඇති කරමින් ප්‍රති පාර්ශ්වකරුවෙකු තම වගකීම් ඉටු නොකිරීමේ අවදානමයි. සමාගම සිය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් (මූලික වශයෙන් වෙළඳ ලැබිය යුතු දේ සඳහා) සහ බැංකු හා මූල්‍ය ආයතනවල තැන්පතු සහ වෙනත් මූල්‍ය උපකරණ ඇතුළුව මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ණය අවදානමට නිරාවරණය වේ.

වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දේ
ණය අවදානමට සමාගම නිරාවරණය වීම ප්‍රධාන වශයෙන් බලපාන්නේ එක් එක් ගනුදෙනුකරුගේ ලක්ෂණ මගිනි. වෙළඳාම සහ වෙනත් ලැබිය යුතු දේ සම්බන්ධයෙන් සිදු වූ පාඩු පිළිබඳ ඇස්තමේන්තුව නියෝජනය කරන හානිකරණ සඳහා දීමනාවක් සමාගම විසින් ස්ථාපිත කරයි. මෙම දීමනාවේ ප්‍රධාන කොටස් වන්නේ තනි තනිව සැලකිය යුතු නිරාවරණවලට සම්බන්ධ විශේෂිත අලාභ සංරචකයකි.

වෙළඳාම සහ වෙනත් ලැබිය යුතු දේ සඳහා වන ණය අවදානම සඳහා වාර්තා කරන දිනයේ දී මුදල් අනුව උපරිම නිරාවරණය පහත පරිදි වේ.

	2024	2023
	රු	රු
ශ්‍රී ලංකා රුපියල්	113,500,464	123,530,979
	113,500,464	123,530,979

මුදල් හා මුදලට සමාන දෑ

සමාගම සතුව 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 221 ක මුදල් හා මුදල් සමාන දෑ (2023 - රු.මි. 178) පැවති අතර, මෙම වත්කම් සඳහා වන උපරිම ණය නිරාවරණය ඉන් නියෝජනය කරයි.

සමාගමේ මුදල් ශේෂයන් දරණ බැංකුවල අදාළ ණය ශ්‍රේණිගත කිරීම් පහත පරිදි වේ;

- ලංකා බැංකුව – AA+(lka)

මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

ආ) ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් පියවා ඇති මූල්‍ය වගකීම් හා බැඳී ඇති බැඳීම් ඉටු කිරීමේදී සමාගමට දුෂ්කරතා ඇතිවීමේ අවදානමයි. ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වන්නේ පිළිගත නොහැකි පාඩු සිදු නොවී හෝ සමාගමේ කීර්ති නාමයට හානියක් නොවන පරිදි, සාමාන්‍ය හා පීඩන තත්වයන් යටතේ නියමිත වේලාවට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි.

ගිවිසුම්ගත ගණනය නොකළ ගෙවීම් මත පදනම්ව සමාගමේ මූල්‍ය වගකීම්වල කල්පිරීමේ පැතිකඩ පහත වගුවේ සාරාංශ කරයි.

2023 දෙසැම්බර් 31 දිනට	**මාස 3 ට අඩු** රු	**මාස 3 - 12** රු	**වසර 5ට වැඩි** රු	**එකතුව** රු
ගෙවිය යුතු වෙනත් දෑ	28,553,205	60,910,077	-	89,463,282
	28,553,205	60,910,077	-	89,463,282

2024 දෙසැම්බර් 31 දිනට	**මාස 3 ට අඩු** රු	**මාස 3 - 12** රු	**වසර 5ට වැඩි** රු	**එකතුව** රු
ගෙවිය යුතු වෙනත් දෑ	30,951,968	46,396,822	-	77,348,790
	30,951,968	46,396,822	-	77,348,790

23.3 අවදානම් කළමනාකරණ අනාවරණය (ඉදිරියට...)

ඇ) වෙළෙඳපොල අවදානම

වෙළෙඳපොල අවදානම යනු වෙළෙඳපොල මිලෙහි වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළෙඳපොල මිල ගණන් අවදානම් වර්ග හතරකින් සමන්විත වේ: පොලී අනුපාත අවදානම, මුදල් අවදානම, වෙළෙඳ භාණ්ඩ මිල අවදානම සහ කොටස් මිල අවදානම වැනි වෙනත් මිල අවදානම. වෙළෙඳපොල අවදානමට ලක්වූ මූල්‍ය උපකරණ අතර ණය සහ ණය ගැනීම්, තැන්පතු, විකිණීමට ඇති ආයෝජන සහ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ඇතුළත් වේ. වෙළෙඳපොල අවදානම් කළමනාකරණයේ පරමාර්ථය වන්නේ ප්‍රතිලාභ ප්‍රශස්ත කරන අතරම පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළෙඳපොල අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමයි.

පොලී අනුපාත අවදානම

මූල්‍ය ආයතන සමඟ තබා ඇති කෙටිකාලීන තැන්පතු සඳහා පොලී අනුපාත අවදානමට සමාගම නිරාවරණය වේ.

මුදල් අවදානම

සේවා ගාස්තු පදනම් වී ඇත්තේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ එකඟ වූ තීරුබදු වගුව මත වන අතර සමාගම ඇ.ඩො.මගින් සිදුකරන සේවාවන් සඳහා සියලුම ඉන්වොයිසි සහ ආදායම් සටහන් කිරීම සිදු කරනු ලබන්නේ ගනුදෙනු කරන අවස්ථාවේ දී ඇ.ඩො. අගය මත වේ. එබැවින් ගනුදෙනු දිනයන්හි දී ලබා දෙන විනිමය අනුපාත මත පදනම්ව සමාගමේ ආදායම උච්චාවචනය වේ.

24. ප්‍රාග්ධන කළමනාකරණය

ආයෝජකයා, ණයහිමියා සහ වෙළෙඳපොල විශ්වාසය පවත්වා ගැනීම සහ ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය පවත්වා ගැනීම සඳහා ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් පවත්වා ගැනීම මණ්ඩලයේ ප්‍රතිපත්තියයි. ප්‍රාග්ධනය කොටස් ප්‍රාග්ධනයෙන් සහ සමාගමේ රඳවා ගත් ඉපැයීම් වලින් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාග්ධනය මත ලැබෙන ප්‍රතිලාභ මෙන්ම සාමාන්‍ය කොටස් හිමියන්ට ලැබෙන ලාභාංශ මට්ටම අධීක්ෂණය කරයි.

විස්තරාත්මක ආදායම් ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

සටහන 25

විකුණුම් පිරිවැය	**2024**	**2023**
	රු	රු
මෙහෙයුම් කාර්ය මණ්ඩලය සඳහා වැටුප්	158,705,934	105,496,841
සේවක අර්ථසාධක අරමුදල	12,255,794	9,127,944
සේවක භාර අරමුදල	2,451,159	1,825,589
වෛද්‍ය නිවාඩු මුදල් කිරීම	5,617,478	4,262,053
මෙහෙයුම් සේවක ප්‍රසාද දීමනා	16,033,333	19,626,332
පාරිතෝෂිත වියදම් -මෙහෙයුම් සේවක	3,908,488	3,500,466
විදුලිය	4,363,711	4,878,806
ජලය	755,714	551,437
දුරකථන ගාස්තු	429,139	472,376
ඉන්ධන හා ලිහිසි තෙල්	21,749,714	24,327,000
යාන්ත්‍රික උපකරණ නඩත්තුව	16,794,210	13,744,448
පිරියත හා යන්ත්‍ර ක්ෂය කිරීම	8,157,324	7,025,981
ඉන්ධන සාම්පල් පරීක්ෂාව	43,175	54,636
සිවිල් වැඩ හා ඉලෙක්ට්‍රික් වැඩ	19,044,197	18,579,420
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	17,996,765	14,097,406
එකතුව	**288,306,135**	**227,570,735**

විස්තරාත්මක ආදායම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

සටහන 26

පරිපාලන වියදම්	2024	2023
	රු	රු
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	1,172,968	1,887,108
කාර්යාල සේවක වැටුප්	39,966,586	26,699,210
සේ.අ.අ.- කාර්යාල සේවක	3,063,948	2,281,986
සේ.භා.අ. - කාර්යාල සේවක	612,790	456,397
සේවක ප්‍රසාද දීමනා- කාර්යාල	4,008,333	4,906,583
වෛද්‍ය නිවාඩු මුදල් කිරීම - කාර්යාල	1,404,370	1,065,513
සමාගමේ උපදේශන ගාස්තු	2,780,366	2,225,597
රක්ෂණ වියදම්	2,635,853	1,837,494
සේවක ගෘහසාධනය	10,757,229	9,920,595
පුහුණු වියදම්	1,102,894	2,247,501
සේවකයින් සඳහා වෛද්‍ය යෝජනා ක්‍රමය	5,563,282	3,725,132
පාරිතෝෂිත - කාර්යාලය	977,122	875,116
Walki-Talkies සඳහා කුලිය	610,056	594,027
දුරකථන ගාස්තු	429,139	472,376
මෝටර්රථ සඳහා ඉන්ධන	6,161,781	7,149,205
රේගු නිලධාරී ගාස්තු	1,234,740	1,224,965
ආරක්ෂක වියදම්	22,839,940	17,163,204
විදුලිය - කාර්යාලය	770,067	860,966
ජලය - කාර්යාලය	1,734,904	1,251,743
බලපත් ගාස්තු/පද්ධති ගාස්තු	916,755	895,487
නීති ගාස්තු	311,157	1,289,895
ක්ෂය කිරීම	9,553,277	8,244,898
මෙ.ටො. 3200 ටැංකි හා ගිනි පෙන සඳහා ක්‍රමක්ෂය	5,406,323	5,406,323
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	185,957	102,117
විගණන ගාස්තුව	662,000	405,000
කාර්යාල නඩත්තුව	2,386,732	3,069,507
කාර්යාල උපකරණ නඩත්තුව	1,278,872	1,579,768
කාර්යාල මෝටර් රථ නඩත්තුව	5,749,197	10,208,774
මෝටර්රථ කුළී ගාස්තු	2,024,064	1,109,500
පෙර ගෙවූ ණය වියදම් - SLFRS	3,341,186	3,193,635
අඩමාන ණය	8,237	-
මුද්දර බදු	400	325
බැංකු ගාස්තු	206,178	165,809
විවිධ වියදම්	552,030	712,110
වෙනත් වියදම්	3,773	6,409
ලිපිද්‍රව්‍ය	2,068,272	3,648,263
ප්‍රචාරණ වියදම්/ව්‍යාපාර ප්‍රවර්ධන	853,000	1,296,571
සනීපාරක්ෂක / භූමි අලංකරණ/ආපන ශාලා සේවා	14,677,822	15,655,366
එකතුව	**158,011,600**	**143,834,475**

** 2024.01.01 දින සිට මූලික වැටුපට 25%ක් හා රු.20,000ක දීමනාවක් සමඟ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සමඟ වැටුප් වැඩිවීමක් ලබාදෙන ලදී*